# ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය

අංක 60 — 1973 මැයි 18 වැනි සිකුරාදා — 1973.05.18

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදි.)


# I වැනි කොටස: (II ආ) වැනි ඡේදය — පළකිරීම්

(වෙන වෙනම ගොනුකරගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)


| | පිට | | පිට |
|---|---|---|---|
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් ... ... ... | 599 | ආණ්ඩුවේ නොවන දැන්වීම් ... ... ... | — |
| තීරණය කළ ටෙන්ඩර් පත් පිළිබඳ දැන්වීම් ... ... | 605 | රට බීම විකිණීමේ බලපත්‍ර සඳහා වූ අයදුම් පත් ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම ... ... ... | 607 | වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම් ... ... | 574 |
| තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම ... ... | 608 | විවිධ දැන්වීම් ... ... ... | — |


සැලකිය යුතුයි.—ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 17 දරන මැණික් (කමා කිරීමේ) පනත සහ ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 18 දරන බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ සිරකරු ශුභ සාදක අරමුදල් පනත 1973 මැයි මස 18 වැනි දින ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයන් වශයෙන් පළවේ.

## ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම්

### කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුව

### නූල් ප්‍රවාහනය කිරීම සඳහා මිළ ගණන් කැඳවීම

කොළඹ 1, බ්‍රිස්ටල් වීදියේ හේමාස් ගොඩනැගිල්ලේ කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් වේයන්ගොඩ, තුල්හිරිය, කැළණිය, මට්ටක්කුලිය, කඳාන, ජා-ඇල, ගල්කිස්ස යන ස්ථානවල සිට මරදානේ හින්ස් පාරේ පිහිටි නූල් වෙළඳ ගබඩාවට හා මරදානේ නූල් වෙළඳ ගබඩාවේ සිට කොළඹ දුම්රිය බඩු ගබඩාවට නූල් ප්‍රවාහණය කිරීම සඳහා මිළ ගණන් කැඳවනු ලැබේ.

2. මිළ ගණන් පහත දැක්වෙන අයුරින් විය යුතුය.

(අ) වේයන්ගොඩ සිට මරදානේ නූල් වෙළඳ ගබඩාවට ප්‍රවාහණය කිරීම සඳහා සැතපුම්කට අයකරන ගාස්තුව.

(ආ) තුල්හිරිය සිට මරදානේ නූල් වෙළඳ ගබඩාවට ප්‍රවාහණය කිරීම සඳහා සැතපුම්කට අයකරන ගාස්තුව.

(ඇ) කැළණිය සිට මරදානේ නූල් වෙළඳ ගබඩාවට ප්‍රවාහණය කිරීමට සැතපුම්කට අයකරණ ගාස්තුව.

(ඈ) මට්ටක්කුලිය සිට මරදානේ නූල් වෙළඳ ගබඩාවට ප්‍රවාහණය කිරීමට සැතපුම්කට අයකරණ ගාස්තුව.

(ඉ) කඳාන සිට මරදානේ නූල් වෙළඳ ගබඩාවට ප්‍රවාහණය කිරීමට සැතපුම්කට අයකරණ ගාස්තුව.

(ඊ) ජා-ඇල සිට මරදානේ නූල් වෙළඳ ගබඩාවට ප්‍රවාහණය කිරීමට සැතපුම්කට අයකරණ ගාස්තුව.

(උ) ගල්කිස්ස සිට මරදානේ නූල් වෙළඳ ගබඩාවට ප්‍රවාහණය කිරීමට සැතපුම්කට අයකරණ ගාස්තුව.

(ඌ) මරදානේ නූල් වෙළඳ ගබඩාවේ සිට කොළඹ දුම්රිය බඩු ගබඩාවට ප්‍රවාහණය කිරීම සඳහා සැතපුම්කට අයකරණ ගාස්තුව.

3. මිළ ගණන් 1973.06.07 දින පෙ. ව. 10.30 ට හෝ ඊට පෙර කොළඹ 1, බ්‍රිස්ටල් වීදියේ, හේමාස් ගොඩනැගිල්ලේ කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුවේ ටෙනඩර් මණ්ඩලයේ සභාපති තැන වෙත ලැබීමට සැලැස්විය යුතුය.

4. "නූල් ප්‍රවාහණය කිරීම සඳහා මිළගණන්" යනුවෙන් ලියුම් කවරයේ වම් කෙළවරේ සඳහන් කළ යුතුය.

5. වැඩි විස්තර සඳහා කුඩා කර්මාන්ත අධ්‍යක්ෂගෙන් විමසන්න.

සෝමපාල ගුණධීර,
කුඩා කර්මාන්ත අධ්‍යක්ෂ.

යොමු අංකය 3/1-(5/50).
කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුව,
හේමාස් ගොඩනැගිල්ල,
කොළඹ 1,
1973.05.08.

5–391—73.05.18 දින අංක 60 දරණ ගැසට් පත්‍රය

---

### සැලකිය යුතුයි

ශ්‍රී ලංකා ජනරජයේ සතිපතා පළවන ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (II අ) සහ (II ආ) වැනි ඡේදයෙහි පළවිය යුතු දැන්වීම් ගැසට් පත්‍රය පළවන සතියට පෙර සතියේ බදාදා දහවල් 12.00 ට පෙර රජයේ මුද්‍රණාලයට ලැබිය යුතුයි. ප්‍රමාදවී ලැබෙන දැන්වීම් කුමන හේතුවක් නිසාවත් බාරගනු නොලැබේ.

එල්. ඩබ්ලිව්. ඕ. පීරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

1972 දෙසැම්බර් මස 15 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ.

## වවුනියා දිස්ත්‍රික්කයේ මූලතිව් නානායම් ගොඩනැගිල්ල අළුත්වැඩියා කිරීම

1973. 04. 19 දින, ශ්‍රී ලංකා ජනරජයේ අංක 56 දරණ ගැසට් පත්‍රයේ I වන කොටසේ (II ආ) ඡේදයේ (4-575) 512 වන පිටුවේ පළවූ දැන්වීමට අමතරවයි. වවුනියා දිස්ත්‍රික්කයේ, ඉහත සඳහන් ගොඩනැගිල්ල අළුත්වැඩියා කිරීම සඳහා 1973 මැයි මස 25 වන දින පෙ. ව. 10. 30 දක්වා වවුනියා කච්චේරියේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් රු. 15,000 කට (රුපියල් පහලොස් දාහකට) හෝ ඊට වැඩි ප්‍රමාණයක ගොඩනැගිලි ඉදිකිරීම සඳහා රජයේ ඕනෑම දෙපාර්තමේන්තුවක ලියාපදිංචි වී ඇති ලියාපදිංචි කොන්ත්‍රාත් කරුවන්ගෙන් ටෙන්ඩර් පත් භාරගනු ලැබේ.

2. 1973 මැයි මස 24 වන දින දහවල් 12.00 තෙක් වවුනියා කච්චේරියේ දී ටෙන්ඩර් පෝරම නිකුත් කරනු ලැබේ. ටෙන්ඩර් පෝරම නිකුත් කිරීම පිණිස ලියාපදිංචි සහතිකය ඉදිරිපත් කළ යුතුය.

3. අංක 56-4-575 හා 1973. 04. 19 වන දිනැති ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ පිටු අංක 512 හි 3, 5, 6, 7 ඡේද එසේම පවතී.

4. 1973 මැයි මස 25 වන දින පෙ. ව. 10.45 ට වවුනියා කච්චේරියේ දී ටෙන්ඩර් විවෘත කරනු ලැබේ.

එල්. පී. වික්‍රමාරච්චි.
වවුනියා දිසාපති.

1973 මැයි මස 07 වන දින,
වවුනියා දිසාපති කාර්යාලයේ දී.

5-392—73.05.18 දින අංක 60 දරණ ගැසට් පත්‍රය

---

## වවුනියා දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය පාලනයට අයත් ගොඩනැගිලි අළුත්වැඩියා කිරීම සඳහා ටෙන්ඩර් පත්

1973. 04. 19 දින, ශ්‍රී ලංකා ජනරජයේ අංක 56 දරණ ගැසට් පත්‍රයේ I වන කොටසේ (II ආ) ඡේදයේ (4-575) 511 වෙනි පිටුවේ පළවූ දැන්වීමට අමතරවයි. වවුනියා දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය පරිපාලනයට අයත් ගොඩනැගිලි අළුත්වැඩියා කිරීම සඳහා 1973 මැයි මස 25 වන දින පෙ. ව. 10. 30 දක්වා වවුනියා කච්චේරියේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් රු. 10,000 (දහදාහකට) හෝ ඊට වැඩි ප්‍රමාණයක ගොඩනැගිලි ඉදිකිරීම සඳහා රජයේ ඕනෑම දෙපාර්තමේන්තුවක ලියාපදිංචි වී ඇති ලියාපදිංචි කොන්ත්‍රාත් කරුවන්ගෙන් ටෙන්ඩර් පත් භාරගනු ලැබේ.

2. 1973 මැයි මස 24 වන දින දහවල් 12.00 තෙක් වවුනියා කච්චේරියේ දී ටෙන්ඩර් පෝරම නිකුත් කරනු ලැබේ. ටෙන්ඩර් පෝරම නිකුත් කිරීම පිණිස ලියාපදිංචි සහතිකය ඉදිරිපත් කළ යුතුය.

3. අංක 56-4-575 හා 1973. 04. 19 වන දිනැති ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ පිටු අංක 511 හි 3, 5, 6, 7 යන ඡේද එසේම පවතී.

4. 1973 මැයි 25 වන දින පෙ. ව. 11.00 ට වවුනියා කච්චේරියේ දී ටෙන්ඩර් විවෘත කරනු ලැබේ.

එල්. පී. වික්‍රමාරච්චි,
වවුනියා දිසාපති.

1973 මැයි මස 07 වන දින,
වවුනියා දිසාපති කාර්යාලයේ දී.

5-393—73.05.18 දින අංක 60 දරණ ගැසට් පත්‍රය

---

## කොළඹ වරාය කොමිෂන් සභාව

කොළඹ වරාය කොමිෂන් සභා ටෙන්ඩර් මණ්ඩලයේ සභාපතිතුමා විසින් 1973 ජූනි මස 20 වෙනි දින පස්වරු 2.30 දක්වා කොලොන්නාව තෙල් මධ්‍යස්ථානයේ ඇති විෂ්කම්භය අඟල් 10 ක් ඇති පාවිච්චි කරන ලද වානේ පයිප්ප අඩි 17,000 ක් විකිණීම සඳහා ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ. 1973 ජූනි මස 20 වෙනි දින පස්වරු 2.30 ට ටෙන්ඩර් පත්‍ර විවෘත කරන විට ටෙන්ඩර්කරුවන්ට එහි පෙනී සිටින්ට අවසර දෙනු ලැබේ.

2. ටෙන්ඩර් පත්‍ර රිජිස්ටර් තැපෑලෙන් නොඑවන අය විසින් ටෙන්ඩර් මණ්ඩලයේ සභාපතිතුමා විසින් ටෙන්ඩර් භාරගැනීම සඳහා බලය පවරන ලද නිලධාරියාට ටෙන්ඩර් පත්‍ර පුද්ගලිකව භාර දී ඒ පිළිබඳව එම නිලධාරියාගෙන් කුවිතාන්සියක් ලබාගත යුතුය. නැතහොත් ටෙන්ඩර්කරුවන්ට තමන්ගේ ටෙන්ඩර් දෙපාර්තමේන්තු ටෙන්ඩර් පෙට්ටියෙහි පුද්ගලිකව තැන්පත් කළ හැක.

3. ටෙන්ඩර් පිළිබඳ ලිපි ලේඛණ කොළඹ වරාය කොමිෂන් සභා කායඝීලයේදී පරීක්ෂා කළ හැක. රු. 200 ක මුදලක් වරාය කොමිෂන් සභා කායඝීලයේ තැන්පත් කර ඒ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කළ විට ටෙන්ඩර් පෝර්ම කොළ ලබාගත හැක. ටෙන්ඩර කොන්දේසිවලට අනුව ඇති මුදල ආපසු ගෙවනු ලැබේ.

4. ඉහත සඳහන් අන්දමට ලබාගත් පෝර්ම කොළවල ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතුයි. 1973 ජූනි මස 18 වෙනි දින දවල් 12 දක්වා ටෙන්ඩර් පෝර්ම කොළ නිකුත් කරනු ලැබේ.

ඇස්. ඈම්. බී. දොළපිහිල්ල,
වැඩ බලන වරාය කොමසාරිස්.

කොළඹ වරාය කොමිෂන් සභාව,
කොළඹ 1.
1973.05.18

5-383—73.05.18 දින අංක 60 දරණ ගැසට් පත්‍රය

---

## සුරාබදු දෙපාර්තමේන්තුව

### හල්මිල්ල ප්‍රවාහන පීප්ප සැපයීම

ප්‍රවාහන පීප්ප සැපයීම සඳහා කොළඹ 1, හේමාස් ගොඩනැගිල්ලේ සුරාබදු දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් 1973 ජූනි මස 8 වැනි දින පෙ. ව. 10 දක්වා ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ.

2. ටෙන්ඩර් නියමිත ආකෘති පත්‍රයෙහි ලියා ඉදිරිපත් කළ යුතුය. එම ආකෘති පත්‍ර 1973 ජූනි මස 7 වැනි දින ප. ව. 2 දක්වා සුරාබදු කොමසාරිස් වෙතින් ඉල්ලුම්කර ලබාගත හැකිය.

3. සෑම ටෙන්ඩරයක්ම පිටපත් 2 කින් යුක්ත විය යුතුය. මෙම ටෙන්ඩර් පත්‍ර බහා එවන කවරයේ වම් පස මුදුන් කෙළවරේ "හල්මිල්ල ප්‍රවාහන පීප්ප සැපයීම සඳහා වූ ටෙන්ඩර්" යනුවෙන් සඳහන් කර එය කොළඹ 1, හේමාස් ගොඩනැගිල්ල, තැ. පෙ. 1417 සුරාබදු දෙපාර්තමේන්තුව, ටෙන්ඩර් මණ්ඩලය, සභාපති යනුවෙන් වූ ලිපිනයට එවිය යුතුය.

4. ලියාපදිංචි කළ තැපැල මගින්ද ටෙන්ඩර් පත්‍ර එවිය හැකිය. කිසියම් ටෙන්ඩර්කරුවෙකු ස්වකීය ටෙන්ඩර් පත්‍රය මේ අන්දමට එවීමට කැමති නොවන්නේ නම් එවිට සීල් තබන ලද ස්වකීය ටෙන්ඩර් පත්‍රය තමා විසින් හෝ තම නියෝජිතයකු මගින් හෝ කොළඹ 1, හේමාස් ගොඩනැගිල්ලේ සුරාබදු ප්‍රධාන කායඝීලයේ සුරාබදු අධිකාරි වෙත භාරදිය හැකිය. එවිට ඒ මහතා විසින් ඒ විගසම එය ලද බවට ලියවිල්ලක් දෙනු ලැබේ.

5. ටෙන්ඩර් ආකෘති පත්‍ර ලබාගැනීමට පෙර ටෙන්ඩර් තැන්පත් මුදල වශයෙන් රු. 100 ක් සුරාබදු ප්‍රධාන කායඝීලයේ හෝ ඕනෑම කච්චේරියක හෝ තැන්පත් කොට ඒ බවට ලබාගත් කුවිතාන්සියක් ඉදිරිපත් කළ යුතුය.

6. ටෙන්ඩර් විවෘත කරන අවස්ථාවේදී එතැනට පැමිණ සිටීමට ටෙන්ඩර්කරුවන්ට අවසර දෙනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර 1973 ජූනි මස 8 වැනි දින පෙ. ව. 10 ට කොළඹ 1, හේමාස් ගොඩනැගිල්ලේ සුරාබදු දෙපාර්තමේන්තුවේදී විවෘත කරනු ලැබේ.

ජේ. බ. විජේකෝන්,
සුරාබදු කොමසාරිස්.

1973 මැයි මස 8 වැනි දින,
කොළඹ 1, හේමාස් ගොඩනැගිල්ලේ,
සුරාබදු ප්‍රධාන කායඝීලයේ දී ය.

5-385—73.05.18 දින අංක 60 දරණ ගැසට් පත්‍රය

### කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුව

රුවන්වැල්ල බලවේග පෝෂකම් වැඩපල සඳහා මුර මඩුවක් සෑදීම සහ ස්ථාන භාර නිලධාරීගේ කාමරයට සිවිලිම් ගැසීම සඳහා කොළඹ 1, හේමාස් ගොඩනැගිල්ල, කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපතිතුමා විසින් 1973.06.06 දින පෙ.ව. 10. දක්වා ටෙන්ඩර් භාර ගනු ලැබේ.

2. යම්කිසි රජයේ දෙපාර්තමේන්තුවක රු. 5,000 කට හෝ එයට වැඩි මුදලකට ගොඩනැගිලි කොන්ත්‍රාත් වැඩ සඳහා ලියාපදිංචි වී ඇති ගොඩනැගිලි කොන්ත්‍රාත්කරුවන්ට මෙයට සහභාගි විය හැකිය.

3. මෙම කොන්ත්‍රාත්තුවට සහභාගිවීමට කැමැති කොන්ත්‍රාත්කරුවන් විසින් රු. 25 ක ටෙන්ඩර් තැන්පත් මුදලක් මෙම දෙපාර්තමේන්තුවේ හෝ කොළඹින් පිට කච්චේරියක හෝ තැන්පත් කොට 1973. 06. 05 දින පෙ. ව. 12.00 ට පෙර කුවිතාන්සි හා ලියාපදිංචිය ඉදිරිපත් කර ටෙන්ඩර් පත් ලබා ගත යුතු වේ.

සෝමපාල ගුණධීර,
කුඩා කර්මාන්ත අධ්‍යක්ෂ.

යොමුව :—3/—(1/48)
කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුව,
හේමාස් ගොඩනැගිල්ල,
කොළඹ 1,
1973 මැයි මස 07 වැනි දින.

5–335—73.05.18 දින අංක 60 දරණ ගැසට් පත්‍රය

---

### කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුව

මස්කෙලිය බලවේග පෝෂකම් ආයතනය වටා කටු කම්බි ගැසීම සඳහා කොළඹ 1, හේමාස් ගොඩනැගිල්ල, කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපතිතුමා විසින් 1973.06.06 දින පෙ. ව. 10.00 දක්වා ටෙන්ඩර් භාර ගනු ලැබේ.

2. යම්කිසි රජයේ දෙපාර්තමේන්තුවක රු. 10,000 කට හෝ එයට වැඩි මුදලකට ගොඩනැගිලි කොන්ත්‍රාත් වැඩ සඳහා ලියාපදිංචි වී ඇති ගොඩනැගිලි කොන්ත්‍රාත්කරුවන්ට මෙයට සහභාගි විය හැකිය.

3. මෙම කොන්ත්‍රාත්තුවට සහභාගිවීමට කැමැති කොන්ත්‍රාත්කරුවන් විසින් රු. 25 ක ටෙන්ඩර් තැන්පත් මුදලක් මෙම දෙපාර්තමේන්තුවේ හෝ කොළඹින් පිට කච්චේරියක හෝ තැන්පත් කොට 1973.06.05 දින පෙ. ව. 12.00 ට පෙර කුවිතාන්සි හා ලියාපදිංචිය ඉදිරිපත් කර ටෙන්ඩර් පත් ලබා ගත යුතු වේ.

සෝමපාල ගුණධීර,
කුඩා කර්මාන්ත අධ්‍යක්ෂ.

යොමුව :—3/1-(1/49)
කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුව,
හේමාස් ගොඩනැගිල්ල,
කොළඹ 1,
1973 මැයි මස 07 වැනි දින.

5–337—73.05.18 දින අංක 60 දරණ ගැසට් පත්‍රය

---

### කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුව

යටියන්තොට බලවේග පෝෂකම් වැඩපල සඳහා මුර මඩුවක් සෑදීම සහ ස්ථාන භාර නිලධාරීගේ කාමරයට සිවිලිම් ගැසීම සඳහා කොළඹ 1, හේමාස් ගොඩනැගිල්ල, කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තුමා විසින් 1973.06.06 දින පෙ.ව. 10.00 දක්වා ටෙන්ඩර් භාර ගනු ලැබේ.

2. යම්කිසි රජයේ දෙපාර්තමේන්තුවක රු. 5,000 කට හෝ එයට වැඩි මුදලකට ගොඩනැගිලි කොන්ත්‍රාත් වැඩ සඳහා ලියාපදිංචි වී ඇති ගොඩනැගිලි කොන්ත්‍රාත් කරුවන්ට මෙයට සහභාගි විය හැකිය.

3. මෙම කොන්ත්‍රාත්තුවට සහභාගිවීමට කැමැති කොන්ත්‍රාත්කරුවන් විසින් රු. 25.00 ක ටෙන්ඩර් තැන්පත් මුදලක් මෙම දෙපාර්තමේන්තුවේ හෝ කොළඹින් පිට කච්චේරියක හෝ තැන්පත් කොට 1973.06.05 දින පෙ. ව. 12:00 ට පෙර කුවිතාන්සි හා ලියාපදිංචිය ඉදිරිපත් කර ටෙන්ඩර් පත් ලබා ගත යුතු වේ.

සෝමපාල ගුණධීර,
කුඩා කර්මාන්ත අධ්‍යක්ෂ.

යොමුව :—3/1—(1/47)
කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුව,
හේමාස් ගොඩනැගිල්ල,
කොළඹ 1,
1973 මැයි මස 07 වැනි දින.

5–338—73.05.18 දින අංක 60 දරණ ගැසට් පත්‍රය

---

### කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුව

#### මයියොක්කා පිටි සැපයීම සඳහා මිළ ගණන්

මසකට මයියොක්කා පිටි ටොන් 25 ක් සැපයීම සඳහා කොළඹ 1 බ්‍රිස්ටල් වීදියේ හේමාස් ගොඩනැගිල්ලේ කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් මිළ ගණන් කැඳවනු ලැබේ.

2. මිළ ගණන් පත්‍රිකාවල පහත සඳහන් විස්තර අඩංගු විය යුතුය :—

(අ) මසකට සැපයීමට හැකි ප්‍රමාණය.

(ආ) මරදානේ ඩීන්ස් පාරේ නූල් වෙළඳ ගබඩාවට ටොන් එකක් ගෙනත් භාරදීමට මිල.

(ඉ) දෙපාර්තමේන්තුවට අයත් නූල් කැඳ යෙදුම්හලකට ටොන් එකක් ගෙනත් භාරදීමට මිළ: (කුමන කැඳ යෙදුම්හලට දැයි සඳහන් කළ යුතුය)

(ඊ) ගෙනත් භාරදිය නොහැකි නම්, සැපයුම් කරුගේ ගබඩාවෙන් ටොන් එකක් සැපයීමට හැකි මිළ.

3. 1973.06.07 දින උදේ 10 ට හෝ ඊට පෙර ලැබෙන සේ මිල ගණන් කොළඹ 1, හේමාස් ගොඩනැගිල්ලේ, කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති වෙත එවිය යුතුය.

4. කවරයේ වම් පස ඉහල කෙළවරෙහි "මයියොක්කා පිටි සඳහා මිළ ගණන්" යන්න සඳහන් කළ යුතුය.

5. වැඩි විස්තර කුඩා කර්මාන්ත අධ්‍යක්ෂකගෙන් ලබාගත හැක.

සෝමපාල ගුණධීර,
කුඩා කර්මාන්ත අධ්‍යක්ෂ.

යොමුව : 3/1—(4/35)
කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුව,
හේමාස් ගොඩනැගිල්ල,
කොළඹ 1,
1973.05.08.

ග–390—73.05.18 දින අංක 60 දරණ ගැසට් පත්‍රය

---

### පරන්තන් රසායන ද්‍රව්‍ය සංයුක්ත මණ්ඩලය

#### පරන්තන් කර්මාන්තශාලාව පුළුල් කිරීම

(1) පරන්තන් රසායන ද්‍රව්‍ය සංයුක්ත මණ්ඩලය ඉහත සඳහන් පුළුල් කිරීමේ ක්‍රමයට උපකරණ සැපයීම් සඳහා ටෙන්ඩර් කැඳවයි.

(2) මෙම උපකරණ මිලදී ගැනීම සඳහා මුදල් යොදවනුයේ 1973 එක්සත් රාජධානි/ශ්‍රී ලංකා (පරන්තන් පුළුල් කිරීමේ) ණය ගිවිසුමෙනි.

(3) මෙම ටෙන්ඩර් පත්‍ර මුළුමනින්ම කැනාල් දූපත් (*CHANNEL ISLANDS*) සහ අයිල් ඔෆ් මෑන් (*ISLE OF MAN*) ඇතුළු එක්සත් රාජධානියේ නිපදවන හෝ සාදන ලද ද්‍රව්‍ය එක්සත් රාජධානියේ දී මිළදී ගැනීමට පමණක් සීමාවේ.

(4) ටෙන්ඩර් ලියකියවිලි නියමයන් සහ අනෙකුත් විස්තර 1973 මැයි 14 වැනි දින සිට සහකාර සාමාන්‍යාධිකාරී වෙතින් ලබාගත හැකිය.

සභාපති,
පරන්තන් රසායන ද්‍රව්‍ය සංයුක්ත මණ්ඩලය.

තැ. පෙ. 1489,
29, ලේබෝරියා මාවත,
කොළඹ 4,
1973 මැයි මස 3 වැනි දින.

5–401—73.05.18 දින අංක 60 දරණ ගැසට් පත්‍රය

## ලංකා ගමනා ගමන මණ්ඩලය

කොළඹ 5, 200, කිරුළ පාරේ, ලංකා ගමනාගමන මණ්ඩලයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් පහත සඳහන් වැඩ සඳහා 1973 ජූනි මස 06 වෙනි දින පෙ. ව. 10 වන තෙක් සීල් තබා ඉදිරිපත් කරන ටෙන්ඩර් භාරගනු ලැබේ.

| වැඩ විස්තරය | කොන්ත්‍රාත්කරුවන්ගේ අවම ලියාපදිංචි සීමාව |
|---|---|
| | රු. ශත |
| 1. අළුත් වැඩියා කිරීමේ කොටු 6ක් සහ සේවා වලවල් 2ක් තැනීම. තලංගම ඩිපෝව—ඉසි/539. | 1,00,000 00 |
| 2. පොළව කපා පස් සමතලා කිරීම. උඩහමුල්ල ඩිපෝව—ඉසි/545 ... | 25,000 00 |
| 3. වැඩ කොටු 3ක්, කාර්යාලය සහ ගබඩාවක් තැනීම.—බැත්ඩියමුල්ල ඩිපෝව. ඉසි/403. ... | 25,000 00 |

ප්‍රධාන සිවිල් ඉංජිනේරු තැනගෙන් ලබාගත් ආකෘති පත්‍රවල, පිළියෙලකොට අනුපිටපතින් යුතුව ටෙන්ඩර් පත්‍රිකා ඉදිරිපත් කළ යුතුය. අවශ්‍ය සියලුම විස්තර ප්‍රධාන සිවිල් ඉංජිනේරු තැනගෙන් ලබාගත හැකි අතර, අදාල සැලසුම් ආදිය ඔහුගේ කාර්යාලයේදී පරීක්‍ෂා කළ හැක. ලංගම්, රජයේ දෙපාර්තමේන්තුවල හෝ පිළිගත් සංස්ථාවල සිවිල් ඉංජිනේරු වැඩ සඳහා එක් එක් වැඩයට ඉදිරියෙන් පෙන්වා ඇති හෝ ඊට අධිකව ලියාපදිංචි සිටින කොන්ත්‍රාත්කරුවන් ටෙන්ඩර් පත්‍රිකා එවීමට සුදුස්සෝ වෙති. අවශ්‍ය ටෙන්ඩර් ලියකියවිලි නිකුත් කිරීම සඳහා ආපසු ගෙවනු ලබන ටෙන්ඩර් තැන්පත් මුදල් වශයෙන් වැඩ අංක 1, 2 සහ 3 සඳහා එකකට රු. 100 බැගින් ද, ආපසු නොගෙවනු ලබන ටෙන්ඩර් පෝර්ම ගාස්තු වශයෙන් වැඩ අංක 1, 2 සහ 3 සඳහා රු. 25 බැගින් ද ප්‍රධාන ගිණුම් නිලධාරි තැන වෙත 1973 ජූනි මස 05 වෙනි දින දහවල් 12 ට හෝ ඊට පෙර ගෙවා, එම කුවිතාන්සි මාවෙත ඉදිරිපත් කළවිට ටෙන්ඩර් පත්‍රිකා නිකුත් කරනු ලැබේ. තවද, ටෙන්ඩර්කරුවන් සුදුසුදැයි පරීක්‍ෂා කිරීම සඳහා ඔවුන්ගේ සහතික පත් යනාදිය ප්‍රධාන සිවිල් ඉංජිනේරු තැනවෙත ඉදිරිපත් කළ යුතුවේ. ඉහත සඳහන් ටෙන්ඩර් ගාස්තු ප්‍ර. ගි. නි. තැන වෙත මුදලින් තැන්පත් කළ හැක්කේ එම සහතික පත් පිළිගනු ලැබුවේ නම් පමණි.

අංක 200, කිරුළ පාර,
කොළඹ 5.

ප්‍රධාන සිවිල් ඉංජිනේරු තැන,
ලංකා ගමනාගමන මණ්ඩලය.

5–403—73.05.18 දින අංක 60 දරණ ගැසට් පත්‍රය

---

## අධ්‍යාපන අමාත්‍යාංශය

### 1973 වර්ෂය සඳහා ක්‍රීඩා උපකරණ සැපයීම

රජයේ පාසල්වලට අවශ්‍ය ක්‍රීඩා උපකරණ සැපයීම සඳහා කොළඹ 2, මැලේ වීදියේ, අධ්‍යාපන අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයෙහි සභාපති විසින් 1973 ජූනි මස 8 වැනි දින පෙරවරු 10.00 දක්වා ටෙන්ඩර් භාරගනු ලැබේ.

2. ටෙන්ඩර් විවෘත කරන වේලාවේදී එතැන පැමිණ සිටීමට ටෙන්ඩර්කරුවන්ට අවසර දෙනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර, පූර්වෝක්ත 1 වැනි ඡේදයෙහි සඳහන් වන දිනයෙහි එකී වේලාවට අධ්‍යාපන අමාත්‍යාංශ කාර්යාලයේදී විවෘත කෙරෙනු ඇත.

3. ටෙන්ඩර්, නියමිත ආකෘති පත්‍රයෙහි ලියා ඉදිරිපත් කළ යුතුය. එම ආකෘති පත්‍ර 1973 ජූනි මස 07 වැනි දින පස්වරු 3.30 දක්වා කොළඹ 2, මැලේ වීදියේ, අධ්‍යාපන අමාත්‍යාංශයේ ස්ථාවර ලේකම් (සැපයීම් ශාඛාව) ගේ කාර්යාලයේදී ලබාගත හැකිය.

4. සෑම ටෙන්ඩරයක්ම පිටපත් දෙකකින් යුක්ත විය යුතුය. ටෙන්ඩර් පත්‍ර බහා එවන කවරයෙහි වම් පස මුදුන් කෙළවරේ "ක්‍රීඩා උපකරණ සැපයීම—1973 සඳහා ඉදිරිපත් කෙරෙන ටෙන්ඩර් පත්‍රය" යි යනුවෙන් සටහන් කළ යුතුය.

5. ලියා පදිංචි කළ තැපැල් මගින් ද ටෙන්ඩර් පත්‍ර එවිය හැකිය. කිසියම් ප්‍රාදේශීය ටෙන්ඩර්කරුවෙක් ස්වකීය ටෙන්ඩරය මේ අයුරින් එවීමට කැමති නොවන්නේ නම් එවිට එම ටෙන්ඩර මුද්‍රා තබා පෞද්ගලිකව හෝ ස්වකීය නියෝජිතයෙකු මගින් හෝ ටෙන්ඩර් පිළිගැනීමට හා ඒවා ලැබුණු බව දැන්වීමට බලය දී සිටින අධ්‍යාපන අමාත්‍යාංශයේ කාර්යාල සහකාර වෙත භාරදීමට වුවද හැකිය. (එබඳු අවස්ථාවන්හිදී පූර්වෝක්ත 4 වෙනි ඡේදයෙහි සඳහන් වූ විස්තර ද ටෙන්ඩර්කරුවන්ගේ නම හා ලිපිනයද, ටෙන්ඩරය බහා එවන කවරයේ සඳහන් කළයුතුය.)

6. ටෙන්ඩර ආකෘති පත්‍ර ලබාගැනීමට පළමුව ටෙන්ඩර් තැන්පත් වශයෙන් රුපියල් 100 ක් කොළඹ 2, මැලේ වීදියේ, අධ්‍යාපන අමාත්‍යාංශයේ ගෙවීම් ශාඛාවෙහි හෝ කොළඹින් පිට ටෙන්ඩර්කරුවන් විසින් කොළඹින් පිට කච්චේරියක හෝ තැන්පත් කොට, ඒ බවට ලබාගත් කුවිතාන්සියක් ඉදිරිපත් කළ යුතුය.

7. සැම්පල, නියමිත පරිදි ඉදිරිපත් කළ යුතුය.

8. කොළඹ 2, මැලේ වීදියේ, අධ්‍යාපන අමාත්‍යාංශයේ ස්ථාවර ලේකම් (සැපයීම් ශාඛාව) ගෙන් ඉල්ලුම් කොට මේ පිළිබඳ වැඩිදුර විස්තර හා කොන්දේසි ද දැනගත හැකිය.

අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්.

1973. 05. මස 05 වැනි දින,
කොළඹ 2, මැලේ වීදියේ,
අධ්‍යාපන අමාත්‍යාංශයේ දී.

5–353—73.05.18 දින අංක 60 දරණ ගැසට් පත්‍රය

---

## අධ්‍යාපන අමාත්‍යාංශය

### 1973 වර්ෂය සඳහා විද්‍යා උපකරණ සැපයීම

රජයේ පාසැල්වල විද්‍යා විෂයයන් ඉගැන්වීම සඳහා අවශ්‍ය විද්‍යා උපකරණ නිපදවා සැපයීම සඳහා, කොළඹ 2, මැලේ වීදියේ අධ්‍යාපන අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයෙහි සභාපති විසින් 1973 ජූනි මස 08 වැනි දින පෙරවරු 10.00 දක්වා ටෙන්ඩර් භාරගනු ලැබේ.

2. ටෙන්ඩර් විවෘත කරන වේලාවේදී එතැන පැමිණ සිටීමට ටෙන්ඩර් කරුවන්ට අවසර දෙනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර, පූර්වෝක්ත 1 වැනි ඡේදයෙහි සඳහන් වන දිනයෙහි එකී වේලාවට අධ්‍යාපන අමාත්‍යාංශ කාර්යාලයේදී විවෘත කෙරෙනු ඇත.

3. ටෙන්ඩර්, නියමිත ආකෘති පත්‍රයෙහි ලියා ඉදිරිපත් කළ යුතුය. එම ආකෘති පත්‍ර 1973 ජූනි මස 07 වැනි දින පස්වරු 3.30 දක්වා කොළඹ 2, මැලේ වීදියේ අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් (සැපයීම් ශාඛාව) ගේ කාර්යාලයේදී ලබාගත හැකිය.

4. සෑම ටෙන්ඩරයක්ම පිටපත් දෙකකින් යුක්ත විය යුතුය. ටෙන්ඩර් පත්‍ර බහා එවන කවරයෙහි වම්පස මුදුන් කෙළවරේ "විද්‍යා උකරණ සැපයීම 1973 වර්ෂය සඳහා ඉදිරිපත් කෙරෙන ටෙන්ඩර් පත්‍රය" යි යනුවෙන් සටහන් කළ යුතු ය.

5. ලියා පදිංචි කල තැපැල් මගින් ද ටෙන්ඩර් පත්‍ර එවිය හැකිය. කිසියම් ප්‍රාදේශීය ටෙන්ඩර්කරුවෙක් ස්වකීය ටෙන්ඩරය මේ අයුරින් එවීමට කැමති නොවන්නේ නම් එවිට එම ටෙන්ඩරය මුද්‍රා තබා පෞද්ගලිකව හෝ ස්වකීය නියෝජිතයකු මගින් හෝ ටෙන්ඩර් පිළිගැනීමට හා ඒවා ලැබුණු බව දැන්වීමට බලය දී සිටින අධ්‍යාපන අමාත්‍යාංශයේ කාර්යාල සහකාර වෙත භාර දීමට වුවද හැකිය. (එබඳු අවස්ථාවන්හිදී පූර්වෝක්ත 4 වෙනි ඡේදයෙහි සඳහන් වූ විස්තර ද ටෙන්ඩර්කරුවන්ගේ නම හා ලිපිනය ද, ටෙන්ඩරය බහා එවන කවරයේ සඳහන් කළ යුතුය.)

6. ටෙන්ඩර් ආකෘති පත්‍ර ලබා ගැනීමට පළමුව ටෙන්ඩර තැන්පත් වශයෙන් රු. 100 ක් කොළඹ 2, මැලේ වීදියේ, අධ්‍යාපන අමාත්‍යාංශයේ ගෙවීම් ශාඛාවෙහි හෝ කොළඹින් පිට ටෙන්ඩර් කරුවන් විසින් කොළඹින් පිට කච්චේරියක හෝ තැන්පත් කොට, ඒ බවට ලබාගත් කුවිතාන්සියක් ඉදිරිපත් කළ යුතුය.

7. සැම්පල, නියමිත පරිදි ඉදිරිපත් කළ යුතුය.

8. කොළඹ 2, මැලේ වීදියේ, අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් (සැපයීම් ශාඛාව) ගෙන් ඉල්ලුම් කොට මේ පිළිබඳ වැඩිදුර විස්තර හා කොන්දේසි ද දැනගත හැකිය.

අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්.

1973 මැයි මස 05 වැනි දින,
කොළඹ 2, මැලේ වීදියේ,
අධ්‍යාපන අමාත්‍යාංශයේ දී ය.

5–354—73.05.18 දින අංක 60 දරණ ගැසට් පත්‍රය

### සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

### වර්ණ ඡායාරූප සැපයීමේ ටෙන්ඩර් කැඳවීම

කොළඹ 10, අංක 385, ඩීන්ස් පාරේ ලාදුරු මර්දන ව්‍යාපාර අධිකාරී විසින් පහත සඳහන් කොන්දේසිවලට අනුකූලව ටෙන්ඩර්පත් ප්‍රසිද්ධ වෙළඳ ආයතන වලින් හෝ පුද්ගලයන්ගෙන් භාරගනු ලැබේ.

7"×5" සහ 9½"×7" ප්‍රමාණයේ විශාල කරන ලද වර්ණ ඡායාරූප සැපයීම. විනිවිද පෙනෙන වර්ණ ඡායාරූපවල මුල් පිටපත් හෙවත් "නැගටිව්" සපයනු ලැබේ.

**කොන්දේසි**

(අ) විශාල කරන ලද ඡායාරූප අලවා විනිවිද පෙනෙන ප්ලාස්ටික් කවරවල බහා සැපයිය යුතුය.

(ආ) ලාදුරු මර්දන ව්‍යාපාරයේ අධිකාරී කාර්යාලයෙන් ලබාගත හැකි ආකෘති පත්‍රවල පිටපත් 2 කින් යුක්තව ටෙන්ඩර් පත්‍ර ඉදිරිපත් කල යුතුය.

(ඇ) කොළඹ කොටුවේ යෝක් වීදියේ පිහිටි ලංකා බැංකුවේ අංක 255 දරණ ගිණුමට බැර කරන ලද රු. 10 ක ආපසු ලබාගත හැකි තැන්පතුවක් තැන්පත් කරන ලද රිසිට් පතක් ඉදිරිපත් කල විට 1973 මැයි මස දවල් 12 දක්වා ටෙන්ඩර් අයදුම් පත්‍ර නිකුත් කරනු ලැබේ.

(ඇ) ටෙන්ඩර් භාරගැනීම 1973 ජූනි මස 9 දින දවල් 12 ට අවසන් වන අතර ටෙන්ඩර්කරුවන්ට ඒවා විවෘත කරන විට පැමිණ සිටීමට ඉඩ දෙනු ලැබේ.

(ඉ) වැඩිමනත් විස්තර ලබාගැනීමත් විනිවිද පෙනෙන ඡායාරූප වල මුල් පිටපත් බලාගැනීමත් පහත සඳහන් කර ඇති ලාදුරු මර්දන අධිකාරී කාර්යාලයේදී කාර්යාල වේලාවන් තුළදී කළහැක.

ඩී. ඇෆ්. පී. සබාපති,
අධිකාරී තැන,
ලාදුරු මර්දන ව්‍යාපාරය.

ජාතික ක්‍ෂය රෝග ආයතන ගොඩනැගිල්ල,
385, ඩීන්ස් පාර,
කොළඹ 10,
73.05.03

5–356—73.05.18 දින අංක 60 දරණ ගැසට් පත්‍රය

---

### වෙළඳ ද්‍රව්‍ය මිළට ගැනීමේ දෙපාර්තමේන්තුව

### හිස් ඇසිඩ් බඳුන් සඳහා ටෙන්ඩර් කැඳවීම

කොළඹ තරුණ බෞද්ධ සමිති ගොඩනැගිල්ලේ 5 වැනි මහලේ පිහිටි වෙළඳ ද්‍රව්‍ය මිළට ගැනීමේ දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් පහත සඳහන් හිස් (ප්ලාස්ටික්) ඇසිඩ් බඳුන් විකිණීම සඳහා 1973 ජූනි මස 8 වැනි දින පෙරවරු 10 තෙක් ටෙන්ඩර් පත් භාර ගනු ලැබේ.

| බඳුන් ගැන විස්තර | විකිණීමට ඇති බඳුන් ගණන |
|---|---|
| ප්‍රමාණය : කිලෝ 35 (ගැලුම් 7) | 1400 (බඳුන් 200යේ කට්ටි 7ක්) |
| ප්‍රමාණය : කිලෝ 18 (ගැලුම් 4) | 1000 (බඳුන් 200යේ කට්ටි 5ක්) |

මට්ටක්කුලියේ, පර්ගියුෂන් පාරේ, 346 වැනි ස්ථානයේ පිහිටි මගේ මධ්‍ය ගබඩාවේදී, සතියේ දිනවල පෙරවරු 9 සිට පස්වරු 3 ඇතුළත ටෙන්ඩර් ඉදිරිපත් කිරීමට අපේක්ෂිත අයවලුන්ට හිස් බඳුන් පරීක්‍ෂා කර බැලීමට හැකිය.

2. හිස් බඳුන් කට්ටියකට රු. 100 බැගින් තැන්පත් මුදලක් තබා 1973 ජූනි 7 වැනි දින දවල් 12 වන තුරු මෙම කාර්යාලයෙන් ලබා ගත හැකි පෝරම සම්පූර්ණ කර අනුපිටපතක් සහිතව ඉදිරිපත් කළ යුතුය. ටෙන්ඩර්කරුවෙකු විසින් ඉල්ලුම් කරනු ලබන සෑම හිස් බඳුන් කට්ටියකටම රු. 100 බැගින් තැන්පත් මුදලක් තැබිය යුතුය. ටෙන්ඩර් පත් භාර ගැනීම අවසන් වන වේලාවට පෙර මෙම කාර්යාලයට ලැබෙන සේ සියලුම ටෙන්ඩර් පත් ලේඛනගත තැපෑලෙන් එවිය යුතුය. නැතහොත් දෙපාර්තමේන්තු කාර්යාලයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ තැන්පත් කළ හැකිය. ටෙන්ඩර් පත් බහා එවන කොපු මුද්‍රා කළයුතු අතර කොපුවේ වම් පස උඩ කෙළවරෙහි "හිස් ඇසිඩ් බඳුන් විකිණීම සඳහා" යනුවෙන් ලකුණු කළ යුතුය. ඉදිරිපත් කරනු ලැබෙන මිළ ගණන් ඉලක්කම් වලින් හා වචන වලින්ද ටෙන්ඩර් පත්‍රයේ සටහන් කළ යුතුය.

3. 1973 ජූනි 8 වැනි දින පෙරවරු 10.30 ට මෙම කාර්යාලයේදී ටෙන්ඩර් පත් විවෘත කරනු ලැබේ. ටෙන්ඩර්කරුට හෝ ඔහුගේ බලයලත් නියෝජිතයෙකුට හෝ මෙම අවස්ථාවේදී පෙනී සිටීමට ඉඩ දිය හැකිය. ටෙන්ඩර්කරුවන් කීපදෙනෙකු විසින් එකට බඳුන් කට්ටියකට එකම මිල ගණනක් ඉදිරිපත් කර තිබුණහොත් එම කට්ටිය ඒ සඳහා තෝරාගත් ටෙන්ඩර්කරුවන් අතර සම සමයේ බෙදා හරිනු ලැබේ.

4. තෝරාගනු ලබන ටෙන්ඩර්කරුවන් විසින් ටෙන්ඩර් කළ බඳුන් සඳහා සම්පූර්ණ වටිනාකම 1973 ජූනි 14 වැනි දා හෝ ඊට පෙර දිනෙක හෝ ගෙවා 1973 ජූනි 14 වැනි දින හෝ ඊට කලින් හෝ හිස් බඳුන් ඉවත් කරගත යුතුය. සම්පූර්ණ මුදල ගෙවීමට අපොහොසත් වන ටෙන්ඩර්කරුවන්ගේ තැන්පත් මුදල් රාජසන්තක කර ඔවුන්ගේ නම් "වගකීම් පැහැර හැර ගිය කොන්ත්‍රාත්කරුවන්ගේ නාමාවලියේ" ඇතුලත් කරනු ඇත.

5. වෙළඳ ද්‍රව්‍ය මිළට ගැනීමේ දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපතිට හේතු අනාවරනය නොකර මුළු ටෙන්ඩරය හෝ ටෙන්ඩරයේ කොටසක් හෝ පිළිගැනීමේ හෝ ප්‍රතික්ෂේප කිරීමේ හෝ අයිතිය සතුවේ. එසේම, මෙම ඇසිඩ් බඳුන් එකක් හෝ සියල්ලම හෝ විකිණීම අවලංගු කිරීමටද බලය ඔහු සතුය.

ඇම්. සී. සී. ප්‍රනාන්දු,
ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති.

1973 මැයි මස
වෙළඳ ද්‍රව්‍ය මිළට ගැනීමේ දෙපාර්තමේන්තුවේ දීය.

5–451—73.05.18 දින අංක 60 දරණ ගැසට් පත්‍රය

---

### කොළඹ දිස්ත්‍රික්කයේ (පහත්බිම් ප්‍රදේශ) ගොඩ කිරීමේ හා සංවර්ධනය කිරීමේ මණ්ඩලය

කාක දිවයිනේ ගොඩකිරීමේ ව්‍යාපාරය සඳහා බොරළු පස් සැපයීම

පරිවහනය, පිරවීම, සමතලා කොට ඝන කිරීම ඇතුලත්ව ඉහත සඳහන් යෝජනා ක්‍රමයට බොරළු පස් සැපයීම සඳහා 1973 ජූනි මස 08 වැනි දින පෙ. ව. 10 දක්වා ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ.

2. ඉල්ලුම්පත් ඉදිරිපත් කිරීම සඳහා සකස් කරන ලද ආකෘති පත්‍ර සහ ඒ සම්බන්ධයෙන් අවශ්‍ය අනිකුත් විස්තරද පහත අත්සන් කළ අයගෙන් ලබා ගත හැකි වන අතර එකී ටෙන්ඩර් දෙපිට පතකින් යුක්තව ඉදිරිපත් කළ යුතු බවද සැළකිය යුතුයි.

3. රු. 1,00,000 කට හෝ ඊට වැඩි ගණනකට දෙපාර්තමේන්තුවක/මණ්ඩලයක/රජයේ සංස්ථාවක ලියාපදිංචි වූ කොන්ත්‍රාත්කරුවන්ගේ ලියාපදිංචි වීමේ පොත හා ටෙන්ඩර් තැන්පත් මුදල වන රු. 100 ගෙවූ බවට මණ්ඩලයේ ගණකාධිකාරි තැනගෙන් ලබාගත් කුවිතාන්සියක් ඉදිරිපත් කරනු ලබන අයවලුන් වෙත 1973 ජූනි මස 05 දින දහවල් 12 දක්වා ටෙන්ඩර්පත්‍ර නිකුත් කරනු ලැබේ. නිකුත් කරනු ලබන ටෙන්ඩර් පත්‍රිකා වෙනුවෙන් ආපසු නොගෙවන රු. 10 ක ටෙන්ඩර් ගාස්තුවක් අය කරනු ලැබේ.

4. සෑම ටෙන්ඩර්කරුවකුම ඉහතකී කාර්යයට අදාල තමා සතු යන්ත්‍රෝපකරණ හිමි අයකු හෝ ඒවා පිටින් කුලියට ගැනීමේ හැකියාවක් ඇති අයකු විය යුතුය. මෙකී යන්ත්‍රෝපකරණ සම්බන්ධ වැඩි විස්තර මණ්ඩලය මගින් නිකුත් කරනු ලබන ටෙන්ඩර් පත්‍රිකාව සමග ඇති "ටෙන්ඩරය දෙනු ලබන කොන්දේසි" සමග නිකුත් කරනු ලැබේ.

5. සෑම ටෙන්ඩරයක්ම ලිපි කවරයක් තුළ බහා මුද්‍රා තබා එවිය යුතු අතර, ලිපි කවරයේ උඩ වම් කෙළවරෙහි "කාක දිවයින ගොඩ කිරීමේ ව්‍යාපාරය සඳහා ටෙන්ඩර්පත්‍ර" යන්න සඳහන් කළ යුතුයි. ටෙන්ඩර්පත්‍ර ලේඛනගත තැපෑලෙන් එවීම හෝ මණ්ඩලයීය කායඹාලයේ ඇති ටෙන්ඩර් පෙට්ටියෙහි තැන්පත් කිරීම කළ හැකියි.

සභාපති.

අංක 4, 22 වෙනි පටුමග,
කොළඹ 3,
1973 මැයි මස 10 වෙනි දින.

5–521—73.05.18 දින අංක 60 දරණ ගැසට් පත්‍රය

**අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුව**

අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුවේ, ශීත ගබඩාවේ අශ්වබල 15 මෝටර් දෙකක් හා අශ්වබල 100 මෝටර් 1 ක් නැවත වයර් එතීම සඳහා 1973, ජූනි මස 11 වැනි දින ප. ව. 2 දක්වා ටෙන්ඩර් **මණ්ඩලයේ සභාපති විසින් ටෙන්ඩර් පත්‍ර කැඳවනු ලැබේ.**

2. නියමිත ටෙන්ඩර් ආකෘති පත්‍ර රුපියල් සියයක (100) ක නැන්පත් මුදලක් ගෙවා ලබා ගනු ලබන කුවිතාන්සිය ඉදිරිපත් කිරීමෙන් 1973 ජූනි 11 වැනි දින දවල් 12 දක්වා, කොළඹ 1, බී. එස්. එස්. අයි. ගොඩනැගිල්ලේ, අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයෙන් ලබාගත හැක.

3. වැඩි විස්තර හා අදාල මෝටර් පරීක්ෂා කිරීම පිණිස කලින් නියම කර ගත් දිනයකදී කොළඹ 1, ලෝටස් පාරේ, අලෙවි දෙපාර්තමේන්තුවේ ශීත ගබඩාවේ, ඉංජිනේරු හා අධිකාරී තැන හමුවන ලෙස දන්වනු ලැබේ. ඔහුගේ ටෙලිෆෝන් අංකය 27283 වේ.

එන්. වාමදේව,
අලෙවි කිරීමේ කොමසාරිස් වෙනුවට.

අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුව,
බී. එස්. එස්. අයි. ගොඩනැගිල්ල,
කොළඹ 1.
1973. 05. 07.

5–365—73.05.18 දින අංක 60 දරණ ගැසට් පත්‍රය

---

**ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුව, ගාල්ල**

**1973 මුදල් වර්ෂයේ දෙවන භාගය සඳහා ප්‍රාදේශීය ද්‍රව්‍ය මිළදී ගැනීම**

1973 මුදල් වර්ෂයේ දෙවන භාගය සඳහා ගොඩනැගිලි තැනීමේ ප්‍රාදේශීය ද්‍රව්‍ය සැපයිම පිණිස පහත සඳහන් කායාංශයන් වෙනුවෙන් ටෙන්ඩර්පත් මෙසින් කැඳවනු ලැබේ.

**රත්නපුර දිස්ත්‍රික්කය :** ඉඹුල්පෙ.

**සම්බන්ධතොට දිස්ත්‍රික්කය :** මුරුතවෙල අංශ 2, මුරුතවෙල අංශ 3 සහ වීරකැටිය.

2. ගාල්ල, ඉඩම් සංවර්ධන කායාංලයයේදී ගාල්ලේ ඉඩම් සංවර්ධන නිලධාරී විසින් 1973 ජූනි මස 01 දින ප. ව 2 දක්වා 1973 මුදල් වර්ෂයේ දෙවන භාගය සඳහා (1973.07.01 සිට 1973.12.31 දක්වා) **පහත සඳහන් ද්‍රව්‍ය සැපයීමේ ටෙන්ඩර් පත් භාරගනු ලැබේ :—**

(1) වියන ලද ජෝඩු පොල් අතු (7'ක් දික්වූද, 14"ක් පළල්වූ ද 1000 ක මිළ)

**(2) අළුහුනු බුසල් ගණනින් (බුසල් 1ක් රු. 44කට නො අඩු** බර තිබිය යුතුයි)

(3) තම්බාපු හුනු (බුසල් ගණනින්)

(4) කළු ගල් 6" × 9" (කියුබ් ගණනින්)

(5) තලාපු ගල් 2" (කියුබ් ගණනින්)

(6) තලාපු ගල් 1½" (කියුබ් ගණනින්)

**(7) තලාපු ගල් 1" (කියුබ් ගණනින්)**

(8) තලාපු ගල් ¾" (කියුබ් ගණනින්)

(9) තලාපු ගල් ½" (කියුබ් ගණනින්)

(10) පිළිස්සූ ගඩොල් (4½" × 2¾" × 8½" ප්‍රමාණයේ 1000 ක මිළ)

(11) ගඟ වැලි (කියුබ් ගණනින්)

3. ඉහත සඳහන් ද්‍රව්‍ය වෙනුවෙන් පහත සඳහන් පරිදි මිළ ගණන් දැක්විය යුතුයි :—

(i) ලොරි/ට්‍රැක්ටර් ගමන් කළ හැකි (කාර්යාංශයේ සිට සැතපුම් 6 ක් ඇතුලත) ස්ථානයකදී ද්‍රව්‍ය භාරදීම කළ යුතුයි. ද්‍රව්‍ය ප්‍රවාහනය දෙපාර්තමේන්තු වාහන මඟිනි.

(ii) ගල් පිපිරීම් සඳහා පුපුරන ද්‍රව්‍ය දෙපාර්තමේන්තුවෙන් සපයනු නො ලැබේ.

(iii) ද්‍රව්‍ය සැපයීම් ස්ථානයේ සිට වැඩබිමට ඇති දුර දැක්විය යුතුයි.

4. එක් එක් දිස්ත්‍රික්කයක් වෙනුවෙන් රුපියල් පණහක් (රු: 50 ක්) බැගින් තැන්පත් කර ලබාගත් රිසිට්පතක් ඉදිරිපත් කර ටෙන්ඩර් අයදුම් පත් ලබාගත හැකිය. සියලුම තැන්පත් මුදල් මගේ කායාංලයයේ හෝ ඕනෑම කච්චේරියක තැන්පත් කළ හැකි අතර, එම රිසිට්පත් ගාල්ලේ, ඉඩම් සංවර්ධන නිලධාරි කායාංලයට ඉදිරිපත් කිරීමෙන් පසුව ටෙන්ඩර් අයදුම්පත් ලබාගත හැකිය. ටෙන්ඩර් පත් ලබාගත හැකි අවසාන දිනය 1973 මැයි මස 31 දින පෙ. ව. 11.30 තෙක් පමණක් බව සලකන්න.

5. සෑම ටෙන්ඩර් අයදුම්කරුවෙක්ම ඔහුගේ නම සහ ලිපිනය පැහැදිලිව සඳහන් කළ යුතුයි. දිස්ත්‍රික්ක වශයෙන් ටෙන්ඩර්පත් ඉදිරිපත් කළ යුතුයි. සියලුම ටෙන්ඩර්පත් පිටපත් දෙකකින් යුතුව ඉදිරිපත් කළ යුතු අතර, ලියාපදිංචි තැපෑලෙන් පහත සඳහන් ලිපිනයට ලැබෙනසේ ඉදිරිපත් කළ යුතුයි. කවරයෙහි වම්පස උඩ කෙළවරෙහි "ගාල්ල ඉඩම් සංවර්ධන කොට්ඨාශයට ගොඩනැගිලි ද්‍රව්‍ය සැපයීම් සඳහා ටෙන්ඩර්පත්" යනුවෙන් පැහැදිලිව සඳහන් කළ යුතුයි. සියලුම ටෙන්ඩර්පත් කවරයක බහා සීල් තබා ඉදිරිපත් කළ යුතුයි.

"ඉඩම් සංවර්ධන නිලධාරී,
ඉඩම් සංවර්ධන කායාංලය,
නාගරශාලා ගොඩනැගිල්ල,
ගාල්ල."

නැතහොත්, ගාල්ල ඉඩම් සංවර්ධන කායාංලයයේ ඒ සඳහා වෙන් කරන ලද ටෙන්ඩර් තැන්පත් පෙට්ටියේ තැන්පත් කළ හැකියි.

6. 1973 ජූනි මස 01 දින ප.ව. 2.30 ට ගාල්ලේ, ඉඩම් සංවර්ධන නිලධාරී විසින් එම කායාංලයයේදී ටෙන්ඩර්පත් විවෘත කරනු ලැබේ. 1973 ජූනි මස 01 දින ප.ව. 2.00 ට පසු ලැබෙන ටෙන්ඩර් පත් භාරගනු නො ලැබේ. ටෙන්ඩර්පත් විවෘත කරන අවස්ථාවේදී යෝග්‍යයැයි සිතේ නම් ටෙන්ඩර් කරුවනට පෙනී සිටිය හැක.

7. සාර්ථක වූ ටෙන්ඩර්කරුට ඒ බව දැන්වූ විට සති දෙකක් ඇතුළත ද්‍රව්‍ය සැපයීමට හැකිවිය යුතුයි. එසේ කිරීමට නොහැකි වූවහොත් ටෙන්ඩර් ගිවිසුම් කඩකළ කොන්ත්‍රාත්කරුවකුසේ සලකා ඒ අනුව කටයුතු කරනු ඇත.

8. ටෙන්ඩර් ගණනාවක් හෝ සියලුම ටෙන්ඩර් හෝ ප්‍රතික්ෂේප කිරීම හෝ ටෙන්ඩරයක කොටසක් භාර ගැනීම හෝ විශේෂ විස්තරයකට අනුකූල නොවූ සැපයීම් ප්‍රතික්ෂේප කිරීමේ සම්පූර්ණ අයිතිය ගාල්ලේ ඉඩම් සංවර්ධන නිලධාරී සතුය.

කේ. අරුණසිරි,
ඉඩම් සංවර්ධන නිලධාරි, ගාල්ල.

1973, අප්‍රේල් මස 28 දින,
ගාල්ලේ ඉඩම් සංවර්ධන කායාංලයයේ දීය.

5–362—73.05.18 දින අංක 60 දරණ ගැසට් පත්‍රය

---

**සෞඛ්‍ය දෙපාර්තමේන්තුව**

**මාතලේ සෞඛ්‍ය සේවා අධිකාරි කොට්ඨාශය**

**කිරි නොමැතිව පිසූ ආහාර සැපයීම**

1973 අප්‍රේල් 4 දතමින් 1973.4.19 දින අංක 56 දරණ ශ්‍රී ලංකා ජන රජයේ ගැසට් පත්‍රයෙහි පල කරන ලද දැන්වීම හා සබැඳියි. එම දැන්වීමේ 4 වන ඡේදයේ සඳහන් උප ලේඛණය මෙහි පහත පල කරමි. මේ අනුව ටෙන්ඩර් භාර ගන්නා අවසාන දිනය හා වේලාව 1973.6.19 වැනි දින පෙරවරු 10 දක්වා කල් දමා ඇත. ටෙන්ඩර් පත් භාර ගන්නා අවසාන දිනට පෙර දිනයෙහි දවල් 12 වනතුරු මෙම කාර්යාලයෙන් හෝ අනුරාධපුරය, බදුල්ල, මඩකලපුව, කොළඹ, ගාල්ල, යාපනය, කළුතර, මහනුවර, කෑගල්ල, කුරුණෑගල, මාතර, පුත්තලම, රත්නපුරය සහ වව්නියාව යන පලාත්වල පිහිටි සෞඛ්‍ය සේවා අධිකාරි වරුන්ගේ කාර්යාල වලින් හෝ ටෙන්ඩර් පෝර්ම ලබාගත හැක.

වෛද්‍ය ඒ. අරුමෛයිනායගම්,
මාතලේ, සෞඛ්‍ය සේවා අධිකාරි.
අ/05/03

වර්ෂ 1973 ක්වූ මැයි මස 2 වැනි දින,
මාතලේ, සෞඛ්‍ය සේවා අධිකාරි කාර්යාලයේ දී ය.

උපලේඛණය—1973

| | ආයතනය | ටෙන්ඩර් සඳහා තැන්පත් | ඇප මුදල | ටෙන්ඩර් භාර ගන්නා අවසාන දිනය හා වේලාව | 6 මසකට ආහාර ප්‍රමාණය දල වශයෙන් — සේවකයන්ට | | | | | නොගෙවන රෝගීන්ට | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | මාළු | මස් | කරවල | එළවළු | බිත්තර | මාලු | මස් | කරවල | එළවලු | බිත්තර |
| | | රු. | රු. | | | | | | | | | | | |
| 1. | හිඟුරක්ගොඩ රෝහල ... | 100... | 1,000 | 1973.06.19 වැනි දින පෙ.ව. 10ට | 250... | 250... | 250... | 750... | 250... | 2,000... | 2,000... | 2,000... | 6,000... | 2,000 |
| 2. | නාලන්ද පර්යන්ත ඒකකය ... | 100... | 800 | | 150... | 150... | 150... | 450... | 150... | 500... | 500... | 500... | 1,500... | 500 |
| 3. | රත්තොට පර්යන්ත ඒකකය | 100... | 800 | | 150... | 150... | 150... | 450... | 150... | 1,000... | 1,000... | 1,000... | 3,000... | 1,000 |
| 4. | ලග්ගල/පල්ලේගම රෝහල | 100... | 800 | | — ... | 250... | 500... | 750... | 500... | — ... | 750... | 1,500... | 2,500... | 1,000 |
| 5. | බකමූණ පර්යන්ත ඒකකය ... | 100... | 800 | | 150... | 150... | 150... | 450... | 150... | 500... | 500... | 500... | 1,500... | 500 |
| 6. | අත්තනකඩවල මාතෘ නිවස... | 100... | 300 | | 150... | 150... | 150... | 450... | 150... | 150... | 150... | 150... | 450... | 150 |
| 7. | ගිරිතලේ මාතෘ නිවාසය ... | 100... | 400 | | 100... | 100... | 100... | 300... | 100... | 200... | 200... | 200... | 600... | 200 |
| 8. | උතුරු—මාතලේ මා.නිවාසය | 100... | 300 | | 100... | 100... | 100... | 300... | 100... | 350... | 350... | 350... | 1,050... | 350 |
| 9. | ඉළුක්කුඹුර මාතෘ නිවාසය ... | 100... | 300 | | 100... | 100... | 100... | 300... | 100... | 150... | 150... | 150... | 450... | 150 |
| 10. | ඕවිලිකන්ද මාතෘ නිවාසය ... | 100... | 400 | | 150... | 150... | 150... | 450... | 150... | 250... | 250... | 250... | 750... | 250 |
| 11. | දේවහුව මාතෘ නිවාසය ... | 100... | 400 | | 150... | 150... | 150... | 450... | 150... | 250... | 250... | 250... | 750... | 250 |
| 12. | මනම්පිටිය මාතෘ නිවාසය ... | 100... | 600 | | 50... | 50... | 50... | 150... | 50... | 150... | 150... | 150... | 450... | 150 |
| 13. | බී.ඕ.පී. 400 ගෘහ රෝහල ... | 100... | 700 | | 200... | 200... | 200... | 600... | 200... | 500... | 500... | 500... | 1,500... | 500 |

5-357—73.05.18 දින අංක 60 දරණ ගැසට් පත්‍රය

---

# තීරණය කළ ටෙන්ඩර්පත් පිළිබඳ දැන්වීම්

## රජයේ සැපයීම් දෙපාර්තමේන්තුව—ටෙන්ඩර් ප්‍රතිඵල

| ටෙන්ඩර් පියවූ දිනය | විෂයය | ලැබුණු ටෙන්ඩර්පත් ගණන | පිළිගත් ටෙන්ඩර්කරු | ඒකකය | පිළිගත් මිළ රු. ශ. |
|---|---|---|---|---|---|
| (1) 72.12.14 ... | 1973 වර්ෂය සඳහා කොට්ට පුළුන් සැපයීම... | දෙකයි ... | ඇම්. ඩී. චාර්ල්ස්, අංක 74, කුඩාබුත්ගමුව, අංගොඩ | රාත්තලක් | 1 59 |
| (2) 72.09.21 ... | දේශීයව නිෂ්පාදිත මදුරු දැල් රෙදි සැපයීම... | එකයි ... | සී/ස. ශ්‍රී ලංකා ඇසෝසියේටඩ් එන්ටප්‍රයිස් අංක 67, බෙල්මන්ට් වීදිය, කොළඹ-12 | යාරයක් ... | 4 50 |
| (3) 73.01.26 ... | සුදු කපු මේස රෙදි (ටේබලින්) සැපයීම ... | එකයි ... | — ... | — ... | ටෙන්ඩරය ප්‍රතික්ෂේප කරන ලදී. |

සැ. ඕ. පෙ. රූපසිංහ,
රජයේ සැපයීම් අධ්‍යක්ෂ.

1973.04.27 දින,
කොළඹ දීය.

5-361—73.05.18 දින අංක 60 දරණ ගැසට් පත්‍රය

---

## රජයේ සැපයීම් දෙපාර්තමේන්තුව—ටෙන්ඩර් ප්‍රතිඵල

| ටෙන්ඩර් පියවූ දිනය | විෂය | ලැබුණ ටෙන්ඩර් පත් ගණන | පිළිගත් ටෙන්ඩර්කරු | ඒකකය | පිළිගත් මිළ | රු. ශ. |
|---|---|---|---|---|---|---|
| | | | විෂය අංක 1 | | | |
| 1972.12.14 ... | මෙරට නිෂ්පාදිත කපු බැනියම් සැපයීම | දෙකයි | මෙල්වික් කර්මාන්තායතනය, 73, හයි ස්ට්‍රීට්, පානදුර | එකක් ... | ප්‍රමාණය 30″, 32″ හා 34″ | 4.0 |
| | | | | | ප්‍රමාණය 36″, 38″ හා 40″ | 4.25 |
| | | | විෂය අංක 2 | | | |
| | | | බර්නාඩ් බොතේජු කර්මාන්තායතනය, 108, දුටුගැමුණු මාවත, දෙහිවල | එකක් | ප්‍රමාණය 32″ හා 34″ | 3.35 |
| | | | | | ප්‍රමාණය 36″, 38″ හා 40″ | 3.85 |
| 1972.07.18 ... | 56″ × 92″ ඇඳ රෙදි (බෙඩ් කවර) සැපයීම | එකයි ... | ප්‍රතික්ෂේප කරණ ලදී. | ... — ... | — | |
| 1972.12.19 ... | 1973 වර්ෂය සඳහා කැන්වස් සපත්තු සැපයීම | දෙකයි ... | සින්වා ඩිස්ට්‍රිබියුටර්ස්, 72, පළමුවෙනි හරස් වීදිය, කොළඹ-11 | ජෝඩුවක් | විෂය අංක 1 | |
| | | | | | ප්‍රමාණ 5–6 | 6.90 |
| | | | | | ප්‍රමාණ 7–12 | 7.65 |
| | | | | | විෂය අංක 2 | |
| | | | | | ප්‍රමාණ 5– 6 | 6.75 |
| | | | | | ප්‍රමාණ 7–10 | 7.50 |
| | | | | | විෂය අංක 3 හා 4 | |
| | | | | | විවිධ ප්‍රමාණයන් | 8.75 |

සැ. ඕ. පෙ. රූපසිංහ,
රජයේ සැපයීම් අධ්‍යක්ෂ.

5-384—73.05.18 දින අංක 60 දරණ ගැසට් පත්‍රය

## පොලිස් දෙපාර්තමේන්තුව

### කොම්පඤ්ඤවීදියේ පොලිස් නිරෝධායන කඳවුරේ අයථා ආගමිකයින්ට පිසින ලද ආහාර සැපයීම

### ටෙන්ඩර් බලපත්‍ර

(අ) ලත් ටෙන්ඩර්වල මුළු ගණන—3

(ආ) පිළිගත් ටෙන්ඩර්කරුගේ නම—නාගූර් මීරා ජෙයිනුල් ආබදීන් මයා., අංක 42, කුමාරන් රත්නම් පාර, කොම්පඤ්ඤවීදිය, කොළඹ 2

(ඇ) කෑම පිළිගත් මිලගණන්

| | කෑම වේලක මිළ ගණන ශත |
|---|---|
| 1. (අ) උදේ තේ ... ... ... | 36 |
| (ආ) දවල් කෑම ... ... | |
| (i) දින 3 ක් තුළ එළවලු ව්‍යංජන දෙකක් සහ සම්බල් සමග බත් ... ... ... | 86 |
| (ii) දින 2 ක් තුළ එළවලු ව්‍යංජන දෙකක් සහ කරවල සමග බත් ... ... ... | 85 |
| (iii) දින 2 ක් තුළ එළවලු ව්‍යංජන දෙකක් හා මාලු සමග බත් | 85 |
| (ඇ) සවස තේ හෝ කෝපි ... ... | 10 |
| (ඈ) රාත්‍රී කෑම ... ... ... | 40 |
| 2. රෝගීන්ගේ කෑම ... ... ... | 80 |

වී. රාසසිංහම්,
ගණකාධිකාරී.
කොළඹ පොලිස් අධිකාරි වෙනුවටය,

පොලිස් අධිකාරි කාර්යාලය,
ඇවිලන් චතුරශ්‍රය,
කොළඹ 1, 1973 මැයි මස 3 වැනි දින.

5–363—73.05.18 දින අංක 60 දරණ ගැසට් පත්‍රය

---

## රජයේ ගැසට් පත්‍රය මගින් කැඳවන ලද විවෘත ටෙන්ඩර් පිළිබඳ තීරණ—ප්‍රාදේශීය සිවිල් ඉංජිනේරු සංවිධානය—බටහිර දිසාව

| සැපයීමේ/සේවයේ විස්තරය<br>1 | ටෙන්ඩර්පත් පියවූ දිනය<br>2 | ලැබූ ටෙන්ඩර් ගණන<br>3 | පිළිගත් ටෙන්ඩර්කරුගේ නම සහ ලිපිනය<br>4 | පිළිගත් ටෙන්ඩර් මුදල<br>5 |
|---|---|---|---|---|
| **1 වෙනි සැකපුමට** | | | | |
| කැළණි උතුරු බැම්මට බොරළු කියුබ් 2500 ක් සැපයීම | 1971.08.19 ... | තුනයි ... | යූ. ඊ. පෙරේරා මහතා, 624, වේල්ස් කුමාර මාවත, කොළඹ–14 | රු.56,000. 0 |
| **2 වෙනි සැකපුමට** | | | | |
| කැළණි උතුරු බැම්මට බොරළු කියුබ් 2500 ක් සැපයීම | 1972.06.14 ... | දෙකයි ... | කේ. පී. වී. ද සිල්වා මහතා, 89, ස්ටැපඩ පෙදෙස, කොළඹ–10 | රු. 70,000 0 |
| හිස්තාර පිප්ප/හිස් වානේ පිප්ප සහ හිස් සිමෙන්ති කරදසි උර මිලදී ගැනීම/අස්කර ගැනීම | 1971.10.20 ... | දහයයි ... | **හිස් තාර පිප්ප**<br>ඒ. ඇලෝසියස් සේවියර් මහතා, 356, මීගමුව පාර, වත්තල<br>**හිස් වානේ පිප්ප**<br>එම්. සෆිපනල්ලා ඛාන් මහතා, 257/2, මීරානියා වීදිය, කොළඹ-12. | ලබාගන්නා ස්ථාන 4න්ම පිප්පයක් රු. 4.81 බැගින්<br>පිප්පයක් රු.14.65බැගින්<br>පිප්පයක් රු14.00බැගින්<br>පිප්පයක්රු.13.65බැගින්<br>පිප්පයක්රු. 10 00බැගින් |
| | | | **හිස් සිමෙන්ති උර**<br>එම්. අබ්දුල් ජබර් මහතා, 100, අළුත්-කඩේ, කොළඹ–12 | එකක් රු. 0.52 බැගින්<br>එකක් රු. 0.49 බැගින්<br>එකක් රු. 0.47 බැගින්<br>එකක් රු. 0.45 බැගින් |
| හිස්තාර පිප්ප/හිස් වානේ පිප්ප සහ හිස් කරදසි උර මිලදී ගෙන අස්කර ගැනීම | 1972. 8.21 ... | හතයි ... | 1. **හිස් තාර පිප්ප** | එකක් රු. 6.82 බැගින් එකතු කිරීමේ ස්ථාන 4 කින් |
| | | | 2. **හිස් වානේ පිප්ප** | එකක් රු. 21.05 බැගින් එකතු කිරීමේ ස්ථාන 4 කින් |
| | | | 3. **හිස් සිමෙන්ති උර**<br>(1), (2) සහ (3) සඳහා රන්ජිත් කරුණාරත්න මහතා "සමය" බක්මීගහ පාර, පෝරේ, අතුරුගිරිය | එකක් රු. 0.36 බැගින් එකතු කිරීමේ ස්ථාන 3 කින් |
| | | | (4) **හිස් කරදසි සිමෙන්ති උර**<br>ඒ. ඒ. සේවියර් මහතා, 356, මීගමුව පාර, වත්තල | එකක් රු. 0.27 බැගින් එකතු කිරීමේ ස්ථාන එකකින් |
| හිස්තාර පිප්ප/හිස් වානේ පිප්ප සහ හිස් කරදසි සිමෙන්ති උර මිලදී ගෙන අස්කර ගැනීම | 1972.12. 8 ... | තුනයි ... | (1) **හිස් තාර පිප්ප** ... | එකක් රු. 7.02 බැගින් එකතු කිරීමේ ස්ථාන හතරකින් |
| | | | (2) **හිස් කරදසි සිමෙන්ති උර**<br>(1) සහ (2) සඳහා රන්ජිත් කරුණාරත්න මහතා, " සමය " 'බක්මීගහ පාර, පෝරේ, අතුරුගිරිය | එකක් රු. 0.31 බැගින් එකතු කිරීමේ ස්ථාන 4කින් |
| | | | (3) **හිස් වානේ පිප්ප**<br>ඇම්. ඇස්. මොහිඩීන් මහතා, 38, ආමර්වීදිය, කොළඹ-12 | එකක් රු. 15.15<br>එකක් රු. 14.55<br>එකක් රු. 14.15<br>එකක් රු. 13.45 |

ඇන්. පී. ඒ. විජේසේකර,
බටහිර දිසා වැඩ අධ්‍යක්ෂ වෙනුවට.

කොළඹ-7, 1973.05. 03 දින දිය.

5–395—73.05.18 දින අංක 60 දරණ ගැසට් පත්‍රය

# බඩු බාහිරාදිය විකිණීම්

## ප්‍රසිද්ධ වෙන්දේසියක්

කෝපායි එළිමහන් සිර කඳවුරේ සිටින් දෙමුහුන් වර්ගයේ ගවයින් පස් (5) දෙනෙක් 1973.06.06 වෙනි දින පෙරවරු 10.00 ට එම ස්ථානයේදී වෙන්දේසියේ විකුණන බව මෙයින් දැනුම් දෙමි. මෙම ගවයින් ලබා ගත් වහාම ගෙනයා යුතු බවත්, සතියේ දිනවල කායඹිල වේලාවේදී කෝපායි එළිමහන් සිර කඳවුර වෙත පැමිණ මෙම ගවයින් බැලීමට හැකි බවත් මෙයින් දැනුම් දෙමි.

කේ. තංගරාජා,
බන්ධනාගාර අධිකාරි.

යාපනය බන්ධනාගාරයේ දී ය.
73.04.27

5–386—73.05.18 දින අංක 60 දරණ ගැසට් පත්‍රය

---

## රේගුවේ වෙන්දේසියක්

පහත සඳහන් මෝටර් කාර් රථය 1973 මැයි මස 31 වෙනි දින පෙ. ව. 9.30 ට කොළඹ, ශ්‍රී ලංකා රේගුවේ මගින්ගේ පර්යන්ත ගොඩනැගිල්ල අසලදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ. 1973 මැයි මස 30 වෙනි දින සාමාන්‍ය වැඩකරන වේලාව තුළදී ගැණුම්කරුවනට එය පරීක්ෂා කර බැලීමට පිළිවන.

ඉල්ලීම අවසානයේදී වැඩිම ඉල්ලුම්කරු විසින් එහි වටිනාකමින් 50% ක මුදලක් තැන්පත් කළ යුතුය.

වෙන්දේසිය අනුමත කර දින හතක් ඇතුළතදී සම්පූර්ණ මුදල ගෙවා, එය ගෙන නොගිය හොත් එය නැවත විකුණන බවත්, ඒ සඳහා ගෙවා ඇති අත්තිකාරම් මුදල රාජසන්තක වන බවත් සැලකිය යුතුය.

වෙන්දේසිය පිළිබඳ අනිකුත් කොන්දේසි සඳහා 1954 මැයි මස 28 වෙනි දින ගැසට් පත්‍රය බලන්න.

මර්සිඩීස් බෙන්ස් ඔටොමැටික් මොටර් කාර් රථයක් (පාවිච්චි කළ) ඔබ්. එන්. ඩී. වයි. 933—වමෙන් පැදවීම—දකුණේ "හෙඩ් ලයිට්" එක, මඩිගාඩ් එක, සහ බොනට් එක පලුදු වී ඇත.

සී. එස්. මැන්දිස්,
ප්‍රධාන රේගු අයකැමි වෙනුවට.

මගේ අංකය. ඒඩී/විකිණීම්/93/ඩීඑම්72/110.
1973 මැයි මස 07 වන දින,
කොළඹ, ශ්‍රී ලංකා රේගුවේ දී ය.

5–336—73.05.18 දින අංක 60 දරණ ගැසට් පත්‍රය

---

## රේගුවේ වෙන්දේසිය

පහත දැක්වෙන භාණ්ඩ 1973 මැයි මස 25 දින කොළඹ ශ්‍රී ලංකා රේගුවේ ගමන් බඩු කාර්යාලයේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ. පෙ. ව. 9 ට වෙන්දේසිය ආරම්භ වෙයි. මැයි මස 24 වැනි දින පෙ. ව. 9 සිට දවල් 12 දක්වාත් ප. ව. 1 සිට ප. ව. 3.15 දක්වාත් භාණ්ඩ ප්‍රදර්ශනය සඳහා තබනු ඇත.

(1) සරොම් 2 ක් (පාවිච්චි කළ).
(2) ලේස් රෙදි යාර 1 ක්, හැවිච් රෙදි යාර 1 ක්, කාන්තාවන්ගේ අත් පසුම්බි 1 ක්, හවරි 1 ක්.
(3) ලේබල් මිටි 4 ක් "රූලේ" (ඇලවුම් මුද්‍රිත) "ප්‍රෙච්වර්ක්" ස්වර්ණාභරණ කරුවන්ගේ කියත් ග්‍රෝස් 14 ක් (ජර්මනියේ නිෂ්පාදිත).
(4) මහතුන්ගේ අළුත් කලිසම් 9 ක් (බෑගයත් සමග).
(5) විසිතුරු ස්විච් ග්‍රෝස් 1 ක්.
(6) විදුලි මාර්ග පරීක්ෂාකරන උපකරන—දුසිම් එක බැගින් වූ පෙට්ටි 85 ක් (හම් සූට්කේස් එකත් සමග).
(7) වාතේ විරන්ක් පෙට්ටියක් සමග ප්ලාස්ටික් සෙරෙප්පු ජෝඩු 12 ක්.
(8) බයිසිකල් අමතර කොටස්—ප්‍රීවිල් සෝල්ස් (බල්ලෝ)—එකක කොටස 100 පමණ වූ පෙට්ටි 6 ක්.
එම පෙට්ටි 2 ක් (ඇසුරුම් නොමැති).
(9) පොප්ලින් රෙදි යාර 12 ක කැබැල්ලක් (අඟල් 44" පළල ඉංග්‍රීසි නිෂ්පාදනය)
(10) ලුංගි රෙදි කැබලි 2 ක්—ඉන්දුනීසියානු බතික් මුද්‍රණ සහිත
(11) ලුංගි රෙදි කැබලි 2 ක්—ඉන්දුනීසියානු බතික් මුද්‍රණ සහිත
(12) ලුංගි රෙදි කැබලි 2 ක්—ඉන්දුනීසියානු බතික් මුද්‍රණ සහිත
(13) ලුංගි රෙදි කැබලි 2 ක්—ඉන්දුනීසියානු බතික් මුද්‍රණ සහිත
(14) ලුංගි රෙදි කැබලි 2 ක්—ඉන්දුනීසියානු බතික් මුද්‍රණ සහිත
(15) ලුංගි රෙදි කැබලි 2 ක්—ඉන්දුනීසියානු බතික් මුද්‍රණ සහිත
(16) ඉන්දුනීසියානු සරොම් 2 ක් (පාවිච්චි කළ).
(17) ඉන්දුනීසියානු සරොම් 2 ක් (පාවිච්චි කළ).
(18) ඉන්දුනීසියානු සරොම් 3 ක්.
(19) සරොම් 3 ක් (පාවිච්චි කළ).
(20) සරොම් 1 ක් සුදු (පාවිච්චි කළ).
(21) "පර්ජෝ" කාර් සඳහා ෂොක් ඇබ්සෝබර්ස් 4 ක්, පාවිච්චිකළ සූට් කේසයත් සමග.
(22) "පර්ජෝ" කාර් සඳහා ෂොක් ඇබ්සෝබර්ස් 2 ක්.
(23) "පර්ජෝ" කාර් සඳහා—ඩ්රම් බ්රේක් ස්ප්‍රිං රිටේනර් පැකට් 5 ක්.
(24) සිට (35) දක්වා, බ්රේක් සිලිංඩර් රිපෙයාර් මෙවලම් කට්ටල සෙට් 12 ක් "ලොක්හීඩ්" කොටස් අංක 4448—18 "පර්ජෝ"
(36) සිට (43) දක්වා, බ්රේක් සිලිංඩර් අලුත්වැඩියා මෙවලම් කට්ටල සෙට් 8 ක් "ලොක්හීඩ්" කොටස් අංක 4449—09.
(44) බෝල් රේසර් 2 ක්—"එස්කේඑෆ්—පර්ජෝ කොටස් අංක 3326—10—6207/සී4.
(45) සිට (48) දක්වා ප්ලැටිනම් පොයින්ට් සෙට්ස් කට්ටල 4 ක්—කෝඩ් අංක 412.00003—5927 "පර්ජෝ".
(49) තෙල් වැසුම් (ඔයිල් සීල්) 2 ක් පර්ජෝ 3124.08.
(50) ස්ටාටර් බ්‍රශ් එකක්.
(51) තෙල් පොම්ප අළුත්වැඩියා උපකරණ කට්ටලයක් පර්ජෝ 1499.07.
(52) සිට (56) දක්වා මාස්ටර් සිලිංඩර් අළුත්වැඩියා මෙවලම් කට්ටල සෙට් 5 ක්—4633—16 "පර්ජෝ".
(57) සිට (59) දක්වා වතුර පොම්ප අළුත්වැඩියා මෙවලම් කට්ටල පැකට් 3 ක්—පර්ජෝ 1245.
(60) මෝටර් රථ අමතර කොටස් පැකට් 3 ක්—ඇහුරුම් නොමැත් "පර්ජෝ"
(61) මෝටර් රථ අමතර කොටස්—රොඩ්ස් 5 ක් "පර්ජෝ".
(62) රිංග්ස් 5 ක්, ලෝහ අමතර කොටස් 5 ක් සහ "ලොක්හීඩ්" රබර්වලින් තැනූ කොටස් 5 ක් අඩංගු මෝටර් රථ අමතර කොටස් පැකට් 1 ක්—"පර්ජෝ".
(63) මෝටර් රථ අමතර කොටස් පැකට් 1 ක් (ලෝහ සහ රබර් වලින් සාදන ලද අමතර කොටස් 2 ක්, ස්ප්‍රිං 2 ක්, "ලොක්සීඩ්" රබර් කොටස් 3 ක් සහ කුඩා ලෝහ කොටස් 1 ක් අඩංගු).
(64) සිට (67) දක්වා, පර්ජෝ කාර් සඳහා ෂොක් ඇබ්සෝබර්ස් 4 ක්.
(68) සිට (70) දක්වා, ඩිස්ට්‍රිබියුටර් කැප්ස් තුනක්—"පර්ජෝ"—5941.06.
(71) සිට (72) දක්වා, පොම්ප කොටස් 2 ක්—5952.22 "පර්ජෝ"
(73) ලෝහ විලි (මෙටල් බුෂ්) 352309—12 ක් (පර්ජෝ) අඩංගු පැකට් 1ක්.
(74) ලෝහ විලි (මෙටල් බුෂ්) 3561.04—12 ක් (පර්ජෝ) පැකට් 1 ක්.
(75) රබර් සහ ලෝහ විලි 12 ක් 3523.10 (පර්ජෝ) අඩංගු පැකට් 1 ක්.
(76) රබර් සහ ලෝහ විලි 12 ක් 3523.10 (පර්ජෝ) අඩංගු පැකට් 1 ක්.
(77) සිට (80) දක්වා, රෝටර් පැකට් 4 ක්—5937.05 "පර්ජෝ"
(81) සිට (82) දක්වා, රෝටර් පැකට් 2 ක්—5937.05 "පර්ජෝ"
(83) ලෝහමය තෙල් මිනුම් දණ්ඩක්—"පර්ජෝ"—2454.14.
(84) සිට (88) දක්වා, "වර්වෝ" ප්‍රෙෂර් ප්ලේට්ස් 5 ක් පර්ජෝ 2054.16.
(89) සිට (92) දක්වා,, තෙල් මිණුම් දඬු 4 ක්—2454.14 (දඬු 2 යි). 2454.18 (දඬු 2 යි)
(93) සිට (97) දක්වා, "වර්වෝ" ක්ලච් ප්‍රෙෂර් ප්ලේට් 5 ක්,—පර්ජෝ 2054.52—504.
(98) සිට (99) දක්වා, අළුත්වැඩියා මෙවලම් කට්ටල 2 ක් 2498.02 "පර්ජෝ".
(100) සිට (104) දක්වා, ජේසර් 5 ක්—පර්ජෝ 2041.14.
(105) සිට (114) දක්වා, "වර්වෝ" ක්ලච් තෙරපුම් බරු 10 ක් 2141—11 පර්ජෝ.
(115) පෙට්රෝල් පොම්ප කොටස් අවපාත සැකැස්ම (ඩිප්‍රෙෂන් කරෙක්ටර්) 5952.18 "පර්ජෝ".
(116) ඩිස්ට්‍රිබියුටර් හෙඩ් එකක්—පර්ජෝ 5941—11.
(117) හයිඩ්‍රොලික් තිරිංග කොටස් කට්ටල එකක් 2089.10.

(118) සිට (119) දක්වා, ඉග්නිෂන් ස්විච් දෙකක්—පර්ජෝ 4161.22.
(120) පර්ජෝ 1807.13 එන්ජින් මවුන්ට් එකක්.
(121) සිට (127) දක්වා ප්ලැටිනම් පොයින්ට් සෙට්ස් පර්ජෝ 5927.09 පැකට් 7 ක්.
(128) රොඩ් එකක් පර්ජෝ 2444.18.
(129) රොඩ් එකක් පර්ජෝ 2452.11.
(130) පර්ජෝ 2444.26 මෝටර් රථ කොටස් එකක්.
(131) පර්ජෝ 2498.04 අළුත්වැඩියා මෙවලම් කට්ටල එකක්.
(132) පයනියර් "ඊ—6100 මෝස්තරයේ ස්ටීරියෝ ටේප් ඩෙක් එකක්, ගිස් ස්පූල්ස් 7 ක් සමග.
(133) මහතුන්ගේ පාකර් පෑන් 1 ක්, පාකර් බෝල් පොයින්ට් පෑනක් සහ රීපිල් 2 ක් අඩංගු කට්ටල 1 ක්.

2. ඒ ඒ බඩු වෙන්දේසිකර හමාර වූ වහාම භාරගත් ලංසුවට ගැනෙන මුදල සම්පූර්ණයෙන්ම ගෙවූවිට බඩු ඉවත්කරගෙන යාමට දෙනු ලැබේ.

3. කොළඹ ශ්‍රී ලංකා රේගුවේ ගාස්තු නිලධාරියාගෙන් වැඩිමනත් විස්තර ලබාගත හැක.

ජී. ඒ. ද සොයිසා,
ප්‍රධාන රේගු අයකැමි වෙනුවට.

බීබ/73/මැයි, වෙන්දේසිය.
1973 මැයි මස 05 වැනි දින,
කොළඹ—1, ශ්‍රී ලංකා රේගුවේ දීය.

5–343—73.05.18 දින අංක 60 දරණ ගැසට් පත්‍රය

---

රේගු වෙන්දේසිය

මෙහි පහත සඳහන් භාණ්ඩ 1973.05.26 වැනිදා පෙ.ව. 9.00 ට මන්නාරම රේගු කාර්යාලයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

වෙන්දේසිය පැවැත්වීමට පෙර ඕනෑම දිනයක මෙම භාණ්ඩ පරීක්ෂාකර බැලිය හැක.

වෙන්දේසියෙන් පසු වහාම භාණ්ඩ ඉවත්කර ගෙන යා යුතුය.

1. කරාබුනැටි ගෝනි 2 ක්—බර රු. 128
2. කරුංකා ගෝනි 1 ක්—බර රු. 56

එස්. කතිර්කාමනාදන්,
රේගු අයකැමි, මන්නාරම.

මගේ අංකය ඇම්. ඇස්. සී./ඒ/73.
මන්නාරම රේගු කාර්යාලය
1973. 04. 26.

5–359—73.05.18 දින අංක 60 දරණ ගැසට් පත්‍රය

---

# තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම්

**රේන්ද බද්ද, කාරෙයිනගර්-කයිට්ස් පාලම්පාරු සේවය**

**1973 ජූලි 1 සිට 1973 දෙසැම්බර් 31 දක්වා**

1973 ජූලි 1 දින සිට 1973 දෙසැම්බර් 31 දින දක්වා කාලය තුළ කරෙයිනාගර් කයිට්ස් අතර පාලම් පාරු සේවයේ රේන්ද බද්ද මිළදී ගැනීම සඳහා ටෙන්ඩර් පත් යාපනය දිස්ත්‍රික්කයේ දිසාපති තැන විසින් 1973. 05. 31 වැනි දින පෙරවරු 10 දක්වා යාපනය කච්චේරියේ දී භාරගනු ලැබේ.

2. රුපියල් 100ක ටෙන්ඩර් තැන්පත් මුදලක් යාපනය කච්චේරියට භාරදී ලබාගත් කුවිතාන්සියක් ඉදිරිපත් කිරීමෙන් පසු කච්චේරියෙන් ලබාගත හැකි ටෙන්ඩර් පෝර්මවල පිටපත් දෙකකින් යුතුව ටෙන්ඩර්පත් පිළියෙල කළ යුතුය. මින් පසු සඳහන් කරනු ලබන ඇප මුදල නියමිත කාල සීමාව තුළදී බැඳීමට හෝ විකිණීමේ කොන්දේසි ඇප බැඳුම්කරය යනාදිය අත්සන් කිරීමට පිළිගත් ටෙන්ඩර් කරු අපොහොසත් වුවහොත් හෝ ප්‍රතික්ෂේප කළහොත් ඔහුගේ තැන්පත් මුදල රාජසන්තක කරනු ලබන අතර, මින් මතු රජයේ කොන්ත්‍රාත් බදු යනාදිය ලබාගැනීමට නොහැකි වන පරිදි ඔහුගේ නම කොන්ත්‍රාත් පැහැර හරින්නන්ගේ නාම ලේඛනයටද ඇතුළත් කරනු ඇත. අනික් සෑම ටෙන්ඩර්කරුවන්ගේම තැන්පත් මුදල් ජයග්‍රාහක ටෙන්ඩර්කරු විසින් විකිණීමේ කොන්දේසි සහ ඇප බැඳුම්කරය අත්සන් කළ පසු ආපසු ගෙවනු ඇත.

3. සීල් තබන ලද ටෙන්ඩර් පත් 1973. 05. 31 වැනි දින පෙරවරු 10ට පෙර, යාපනය මහලේකම් කාර්යාලයේ දී කච්චේරියේ මගේ කාර්යාල සහකාර තැන වෙත පැමිණ භාරදීමට පුළුවන. සේවයේ විස්තර හා ටෙන්ඩර්කරුගේ නම හා ලිපිනය කවරයේ පිට සඳහන් කළ යුතුය.

4. 1973. 05. 31 වැනි දින පෙරවරු 10ට මගේ කාර්යාල සහකාර තැනගේ කාර්යාලයේ දී ටෙන්ඩර් පත් විවෘත කරන අතර ටෙන්ඩර් පත් විවෘත කරන වේලාවේ ටෙන්ඩර්කරුවන්ට පැමිණ සිටීමට ද අවසර දෙනු ඇත.

5. ඉහතින් සඳහන් කර ඇති දිනය හා වේලාවෙන් පසු ලැබෙන කිසිම ටෙන්ඩර් පත්‍රයක් යලි සලකා බලනු නොලැබේ.

6. කච්චේරියේ දී පරීක්ෂා කළහැකි විකිණීමේ කොන්දේසි කෙරෙහි ටෙන්ඩර් ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වන අයගේ අවධානය යොමු කෙරේ. කාරෙයිනාගර් ජැටියේ සිට කෙලින්ම කයිට්ස් දක්වා ගමන් කරන අයවලුන් හැරුණු විට අනික් අයගෙන් කිසිම රේන්ද ගාස්තුවක් අය නොකළ යුතුය.

7. ටෙන්ඩරය මිළ දී ගන්නා මුදලින් දහයෙන් එකක් වහාම තැන්පත් කිරීමටත්, එම මුදලින් භාගයක් සඳහා පිළිගත් ඇපයක් ඉදිරිපත් කිරීමට හෝ මිළ දී ගත් මුදලින් තුනෙන් එකක් මුදලින් තැන්පත් කිරීමට හෝ ටෙන්ඩරය පිළිගෙන දින දහයක් ඇතුළත පිළිගත් ටෙන්ඩර්කරුට සිදුවනු ඇත.

8. පිළිගත් ටෙන්ඩර්කරු විසින් ඇප බැඳුම්කරය වෙනුවෙන් ඉදිරිපත් කරන දේපලවල ඔප්පු පරීක්ෂාකර බලා ඒ පිළිබඳ සිය අදහස් දක්වීමටත්, ඇප බැඳුම්කරය පරීක්ෂාකොට නිරවුල් කිරීමටත්, ලියකියවිලි පරීක්ෂාකොට, ඇප බැඳුම්කරය පිළියෙල කිරීමත්, වෙනුවෙන් රජයේ නීතිඥ තැනට ගෙවිය යුතු ගාස්තුව සඳහා සෑහෙන මුදලක් ද පිළිගත් ටෙන්ඩර්කරු විසින් තැන්පත් කළයුතු අතර, දේපොල තක්සේරු කිරීමේ ගාස්තු හා මුද්දර ආඥා පණත යටතේ බැඳුම්කරය වෙනුවෙන් ගෙවියයුතු මුද්දර ගාස්තුව ගෙවීමටත් ඔහුට සිදුවනු ඇත.

9. ඇප වෙනුවෙන් ඉදිරිපත් කරන ලද සියළු ඔප්පු සමග එකී දේපොළ නිරවුල් බවට ඉඩම් රෙජිස්ට්‍රාර් තැනගෙන් ලබාගත් සහතිකයක් ද ඉදිරිපත් කළ යුතුය. මෙම සහතික ලබාගත යුත්තේ ඇප බැඳුම්කරය ඉදිරිපත් කරන්නාගේ වියදමෙනි.

10. ටෙන්ඩර්පත් කිසිවක් නොලැබුනහොත්, හෝ ඉදිරිපත් කොට ඇති ටෙන්ඩර් අසතුටුදායක වුවහොත් ටෙන්ඩර් භාරගැනීමට නියමිත දින ටෙන්ඩර්පත් විවෘත කිරීමෙන් පසුව මෙම බද්ද ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට ඉඩ ඇත.

11. කිසියම් ටෙන්ඩරයක් හෝ සියළුම ටෙන්ඩර් පත් කිසිම ප්‍රශ්නයක් නොමැතිව ප්‍රතික්ෂෙප කිරීමේ බලය ආණ්ඩුවේ ඒජන්ත සතුය.

12. ටෙන්ඩර් කර ඇති බද්ද නිසි පරිදි කරගෙන යෑම සඳහා පිළිගත් ටෙන්ඩර්කරු විසින් සේවයෙහි යෙදවිය යුත්තේ ලාංකික කම්කරුවන් පමණකි.

13. ටෙන්ඩර් කර ඇති රේන්ද බද්ද පවත්වාගෙන යාමේදී කම්කරුවන්ම පමණක් සේවයේ යෙදවීම එම බද්දේ කොන්දේසියක් වන අතර, පිළිගත් ටෙන්ඩර්කරු විසින් මෙම කොන්දේසි ක්‍රියාත්මක කිරීමට අපොහොසත් වුවහොත්, එය එකී බද්දේ ව්‍යවස්ථා කඩ කිරීමක් ලෙස සලකනු ලබන අතර, එකී කොන්ත්‍රාත්තුව අවලංගු කිරීමට ද ඉඩ ඇත.

කෙසේ වුවද, විශේෂ අවස්ථාවන්හිදී ආණ්ඩුවේ ඒජන්ත විසින් භාණ්ඩාගාරයේ ද එකගත්වය ඇතිව තමා විසින් කලින් ලියවිල්ලකින් අනුමත කරන ලද ලාංකික කම්කරුවන් සේවයේ යෙදවීමට අවසරයක් දීමට ඉඩ ඇත. එවැනි ලිඛිත අවසරයක් හා එකඟත්වයක් නොමැතිව ලාංකික නොවන කම්කරුවන් සේවයේ යෙදවීම තහනම් ය.

14. මේ පිළිබඳ වෙනත් විස්තර යාපනය ආණ්ඩුවේ ඒජන්ත තැනට ඉල්ලුම් කිරීමෙන් ලබා ගත හැක.

එම්. ටී. ඩබ්ලිව්. අමරසේකර,
යාපනය දිස්ත්‍රික්කයේ දිසාපති.

1973. 05 මස 07 වැනි දින,
යාපනය කච්චේරියේ දී ය.

5–394—73.05.18 දින අංක 60 දරණ ගැසට් පත්‍රය

# ගැසට් පත්‍රය පළකිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය සාමාන්‍යයෙන් සිකුරාද දිනවල පළකරනු ලැබේ. සිකුරාද දිනයක් ආණ්ඩුවේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාද දිනයට ප්‍රථම වැඩකරන දිනයේ ගැසට් පත්‍රය පළකරනු ලැබේ. ඒ අනුව ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා නිවේදන බාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන ප්‍රසිද්ධ නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දින සහ වේලාවන් පහත පළකර ඇති උපලේඛනයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවන්ට පසුව ලැබෙන සියළුම දැන්වීම් එය එවූ අය වෙත තැපැලෙන් ආපසු එවනු ලැබේ. ඊලඟ ගැසට් පත්‍රයේ එය පළකළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් උවමනා ගැසට් පත්‍රයට දැන්වීම් ඇතුළත් වනවාත් හැර එය සියළුදෙනාගේ පහසුවටද හේතු වන බව සලකන්න.

ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති දායක මුදල් භාර නොගනී. සියළුම දායක මුදල් කොළඹ මහලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත කෙළින්ම ගෙවිය යුතුය.

සැ.යු.—මුදල් ගෙවා ගැසට් පතෙහි පළකරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ ප්‍රකාශනාංශයේ අධිකාරි වෙත නොව ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සලකන්න.

## උපලේඛනය

1973

| මාසය | පළකිරීමේ දිනය | | ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දිනය හා වේලාව | | | |
|---|---|---|---|---|---|---|
| මැයි | 73.05.04 | සිකුරාද | ... 73.04.25 | බදාද | දවල් | 12.00 |
| | 73.05.11 | සිකුරාද | ... 73.05.02 | බදාද | දවල් | 12.00 |
| | 73.05.18 | සිකුරාද | ... 73.05.09 | බදාද | දවල් | 12.00 |
| | 73.05.25 | සිකුරාද | ... 73.05.15 | අඟහරුවාද | දවල් | 12.00 |
| ජූනි | 73.06.01 | සිකුරාද | ... 73.05.23 | බදාද | දවල් | 12.00 |
| | 73.06.08 | සිකුරාද | ... 73.05.30 | බදාද | දවල් | 12.00 |
| | 73.06.14 | බ්‍රහස්පතින්ද | ... 73 06.06 | බදාද | දවල් | 12.00 |
| | 73.06.22 | සිකුරාද | ... 73.06.31 | බදාද | දවල් | 12.00 |
| | 73.06.29 | සිකුරාද | ... 73.06.20 | බදාද | දවල් | 12.00 |

එල්. ඩබ්ලිව්. පී. පීරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

1972 ඔක්තෝබර් 20 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රිතයි.